ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පරිපාලිත සමාගම් - 2021

------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ ("මණ්ඩලය") හා එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. එල්.ටී.එල් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් සහ ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදි.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා මණ්ඩලය සහ සමූහය විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ සහ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය සහ සමූහය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව මණ්ඩලය සහ සමූහය කටයුතු කර ඇති බව,
- මණ්ඩලයේ සහ සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව** | | |
| (i) සංකල්ප රාමුවේ 4.1 (ආ) ඡේදයට පටහැනිව, වෙනම ආයතනයක් ලෙස මණ්ඩලය යටතේ මෙහෙයවන සේවක අර්ථසාධක අරමුදලේ වියදම වූ රු. මිලියන 53.63 ක් මණ්ඩලයේ වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණු අතර මෙම කරුණ විස්තරාත්මකව සලකා බැලූ අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩලය විසින් අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් දැරීමේ වත්මන් ප්‍රතිපත්තිය දිගටම කරගෙන යාමට අනුමැතිය ලබා දෙන ලදි. | ගිණුම්කරණ ප්‍රමිතියෙහි ප්‍රතිපාදනවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ii) සංකල්ප රාමුවේ 4.3 ඡේදයට පටහැනිව, අයිතිය මණ්ඩලය සතු රු. මිලියන 8 ක් වටිනා වත්කම් සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රයෝජනයට ගෙන තිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් ලබාදී නොතිබුණි. | සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා වත්කම් භාවිතා කිරීමට නිසි අනුමැතිය ලබා ගත යුතුය. |
| **(ආ) LKAS 2 - තොග සහ LKAS 16 - දේපළ, පිරියත හා උපකරණ**<br>ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි අමුද්‍රව්‍ය සහ පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එකතුව රු. බිලියන 4.04 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයක් සහ අමුද්‍රව්‍ය මිල විචලනයක් පැවතුණි. තවද, රු. බිලියන 1.78 ක් වූ අහිතකර ගබඩා මිළ විචලනයක් පැවතුණි. කෙසේ වෙතත්, එම ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල | තථ්‍ය මිල සහ සම්මත මිල අතර පරතරය අවම කර ගැනීම සඳහා ද්වි වාර්ෂිකව සම්මත මිල ගණන් සමාලෝචනය කරන ලෙස මිල කමිටුවට උපදෙස් දී ඇත. ඉහත සඳහන් කරුණුවලට අමතරව, බරිත සාමාන්‍ය තොග තක්සේරු ක්‍රමය සමඟ ඊආර්පී පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ මණ්ඩලය යෙදී සිටී. මණ්ඩලය ඊආර්පී ක්‍රමය හඳුන්වා දීමත් සමඟ මෙම ගැටළු ඉවත් වනු ඇත. තවද ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් සඳහා පොදු කාර්ය පිරිවැය අවශෝෂණය කර ගැනීමට වෙන්කිරීමේ ක්‍රමයක් තිබිය යුතුය.<br>පොදු කාර්ය අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ ප්‍රාග්ධන හෝ නඩත්තු කාර්යයන්ට අදාළව සෘජුම ආරෝපණය කළ හැකි පොදු කාර්ය භාවිතා කර එම කාර්යයන්ට අවශෝෂණය කිරිමෙන් වේ. | අමුද්‍රව්‍ය සහ පොදු කාර්ය පිරිවැයන් තක්සේරු කිරීමේදී තථ්‍ය පිරිවැය හෝ ආසන්න පිරිවැය පදනම යොදා ගත යුතුය. |

| | | |
|---|---|---|
| මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට වන බලපෑම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය. | | |
| (ඇ) **LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි**<br>සම්පූර්ණයෙන් ක්ෂය වූ රු. බිලියන 197.21 ක ජංගම නොවන වත්කම් ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 2.4.6 (ඉ) අනුව එහි ප්‍රයෝජනවත් ආයු කාලය සංශෝධනය කිරීම සඳහා වාර්ෂිකව සමාලෝචනය නොකර මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණි. තවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී එහි වාහනවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සංශෝධනය කර තිබූ අතර, ඒ අනුව රු. බිලියන 3.17 ක් මුල්‍ය ප්‍රකාශනවල අතීතයට බලපාන පරිදි ගලපා තිබුණි. | විගණන නිරීක්ෂණය විසඳීම සඳහා යාන්ත්‍රණයක් හඳුනා ගැනීමට කටයුතු කරනු ඇත. මෝටර් වාහනවල ප්‍රයෝජනවත් ආයු කාලය වෙනස් කිරීම සම්බන්ධ අවශ්‍ය හෙළිදරව් කිරීම් ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 33 පෙර වර්ෂයේ ගැලපීම් - 12 හි දක්වා ඇත. අමතර හෙළිදරව් කිරීම් අවශ්‍ය නම් එය සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කරනු ඇත. | මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය. |
| (ඇ) **LKAS 16 - දේපළ, පිරියත හා උපකරණ**<br>සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වල වටිනාකම රු. බිලියන 202.9 ක් වූ අතර ඒ අතුරින් රු. බිලියන 201.01 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. | සියලුම වංචල ස්ථාවර වත්කම්වලට අදාළ භෞතික සත්‍යාපනය සාර්ථකව සිදු කර ඇති අතර විගණනයේ අවධානය සඳහා වාර්තා සපයා ඇත. එබැවින්, සම්ප්‍රේෂණ අංශයට අදාළ මෙම වත්කම් භෞතිකව සත්‍යාපනය කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | එල්.කේ.ඒ.එස් 16 ට අනුව සෑම වසරකමදීම ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2010 ඔක්තෝබර් 13 දිනැති කැබිනට් තීරණ අංක 10/2434/423/034 ට අනුව, ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා ලබා ගත් රු. බිලියන 159.18 ක් වූ ණය මුදල ලංකා ගල් අඟුරු සමාගමට (එල්.සී.සී) | මණ්ඩලයේ ශේෂ පත්‍රයේ වත්කම සහ වගකීම යන දෙකම පවතින බැවින් එකී ණය සේවාකරණය ලංවිම වෙත පැවරිය යුතු බව අවධාරණය කරන ලදි. ඉන් අනතුරුව, 2019 වසරේ සිට ණය ගෙවීම් | |

| | | |
|---|---|---|
| පවරා ඇත. භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් අනුව, මෙම ණය මණ්ඩලයේ ඍජු ණය ලෙස සැලකිය යුතුය. ඒ අනුව, සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල ණය ශේෂයේ දිගු කාලීන සහ කෙටි කාලීන කොටස් වෙන වෙනම හඳුනා ගැනීමට ගිණුම්කරණ වැඩපිළිවෙළක් ඇති බවට මණ්ඩලය සහතික විය යුතුය. මණ්ඩලය විසින් කිසිදු වැඩපිළිවෙළක් සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඉහත ගිණුම්කරණ ප්‍රතිකර්මය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | මණ්ඩලයේ ස්කන්ධයට පරිවර්තනය කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දෙන ලදි. | |
| (i) ණය ආපසු ගෙවීම ලෙස 2018 දෙසැම්බර් 31 දිනට පෙර මහා භාණ්ඩාගාරය විසින් කරන ලද රු. බිලියන 61 ක මුදලක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධය ලෙස හඳුනාගෙන නොතිබුණි. | මෙම ණය මණ්ඩලය විසින් ලබා ගන්නා ලද ඍජු ණය ලෙස සැලකීමට භාණ්ඩාගාරය තීරණය කර ඇති බැවින් රජය සමඟ එවැනි උප ණය ගිවිසුම්වලට එළඹී නොමැත. මණ්ඩලයේ ද්‍රවශීලතා සීමාවන් හේතුවෙන් ණය සේවාකරණය භාණ්ඩාගාරය විසින් සිදු කරනු ලබන බැවින් විනිමය අනුපාත පාඩු ඇතුළත්ව ණය දෙන ආයතනයට ගෙවන ලද තථ්‍ය ගෙවීම් ණය ස්කන්ධයට පරිවර්තනයක් ලෙස මණ්ඩලයට පවරා ඇත. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලිඛිත නියෝගය ලැබුණු පසු මණ්ඩලයේ පොත් සකස් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) 1969 අංක 17 දරන විදුලිබල මණ්ඩල පනතේ 42 (6) වගන්තිය අනුව, මණ්ඩලයට ලබා දුන් ණයකට අදාළව ශ්‍රී ලංකා රුපියල නැවත ඇගයීම සම්බන්ධව යම් අලාභයක් හෝ ලාභයක් ඒකාබද්ධ අරමුදලට අය කළ යුතු අතර එම අලාභය හෝ ලාභය රජය විසින් දරනු ලබයි. කෙසේවෙතත්, 2020 සහ 2021 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. මිලියන 6,700 ක සහ රු. මිලියන 676.37 ක විනිමය අලාභයන් මණ්ඩලයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට අතුළත් කර තිබුණි. එම නිසා, 2020 සහ 2021 වසරවල අලාභය පිළිවෙලින් රු.මිලියන 6,700 කින් සහ රු. මිලියන 676.37 කින් වැඩියෙන් දැක්වුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ස්කන්ධය වශයෙන් පරිවර්තනය කරන ලද ණයවල ප්‍රාග්ධන කොටස ආපසු ගෙවීමට අදාළ විනිමය අනුපාත පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කර ඇත. | මණ්ඩලය පනතේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ආ) තොග හිඟයට අදාළ රු. මිලියන 123.86 ක හර ශේෂයක් සහ තොග අතිරික්තයට අදාළ රු. මිලියන 32.65 ක බැර ශේෂයක් නිරවුල් නොකර වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ පැවතුණි. | 2022 ජූනි සිට 2022 අගෝස්තු 31 දක්වා කාලය තුළදී රු. 93,823.50 ක තොග හිඟය නිරවුල් කර ඇත. ඉතිරි ශේෂය නිරවුල් කිරීම සඳහා පසු විපරම් කටයුතු සිදු කරමින් ඇත. සමහර තොග හිඟයන්, තොග අතිරික්තයන් සහ තොග ගැලපීම් නිරවුල් | තොග අතිරික්තය සහ හිඟය ඉක්මනින් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කර ඇත. බස්නාහිර පළාත දකුණ II (WPSII) සම්බන්ධයෙන්, හිඟ ශේෂය නිරවුල් කිරීම සඳහා විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කරනු ඇත. | |
| (ඈ) | ව්‍යාපෘති සඳහා 2014 දෙසැම්බර් 31 න් පසුව විදේශ ණයවලින් ලද රු. බිලියන 25.23 ක් මහා භාණ්ඩාගාරයෙන් ලද උප ණය ලෙස මණ්ඩලය විසින් වාර්තා කර තිබුණි. කෙසේවෙතත්, මෙම ණය ජනරජ ගිණුමේ උප ණය ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද, 2015 මාර්තු 18 දිනැති කැබිනට් තීරණ අංක 15/0228/613/012 ට අනුව මෙම ණය ආපසු ගෙවීමේ වගකීම මණ්ඩලය වෙත පවරා තිබුණි. කෙසේ වෙතත්, මෙම ණය සඳහා ප්‍රාග්ධන කොටස ගෙවීම සහ පොලී ගෙවීම මණ්ඩලය විසින් සිදු කර නොතිබුණු අතර වෙන්කිරීමක් හෝ කර නොතිබුණි. එම නිසා, මෙම ණයවල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2018-01-11 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද රැස්වීමේදී, 2014-12-31 න් පසුව මහා භාණ්ඩාගාරය හරහා මණ්ඩලය වෙත ලබා දී ඇති ණය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව රජයේ ස්කන්ධය බවට පරිවර්තනය කිරීමට තීරණය කරන ලදි. 2021.07.14 දිනැති අංක (FM/AFM(HQ)/භාණ්ඩාගාර ණය) යන ලිපිය මගින් මේ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. එබැවින්, මෙම ශේෂය ස්කන්ධය මාරුකිරීමට භාණ්ඩාගාරයෙන් උපදෙස් ලැබෙන තුරු, මණ්ඩලය එය භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් කර ඇත. | මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කාරණය නිරවුල් කළ යුතුය. |
| (ඈ) | රු. බිලියන 66.83 ක් වූ විදේශ ණය හයක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ණය වශයෙන් හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, මහා භාණ්ඩාගාරය සමඟ එළඹී උප ණය ගිවිසුම් කිසිවක් නොතිබුණි. ඒ අනුව, එම ණය ආපසු ගෙවීමේ වගකීම මණ්ඩලය විසින් නිසි පරිදි හඳුනාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, එම ණය පියවීමට හෝ එම ණයවල ප්‍රාග්ධන කොටස සහ පොලිය ආපසු ගෙවීමට කිසිදු වෙන්කිරීමක් කිරීමට මණ්ඩලය කිසිදු වැඩපිළිවෙළක් සකස් කර නොතිබුණි. එබැවින් එම ණයවල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. | ශ්‍රී ලංකා රජය සහ අදාළ ණය දෙන ආයතනය අතර ණය ගිවිසුම් දැනටමත් අත්සන් කර ඇත. එබැවින් මහා භාණ්ඩාගාරයෙන් ණය සේවාකරණයද සිදු කරයි. මේ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. | මහා භාණ්ඩාගාරය සමඟ උප ණය ගිවිසුම් අත්සන් කළ යුතුය. |
| (ඉ) | 2013 වසරට පෙර රාජ්‍ය ආයතනවලට විදුලි ජනක යන්ත්‍ර, සෝපාන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා මණ්ඩලය විසින් කරනු ලැබූ කාර්යයන් ඒවායේ ඉන්වොයිසි වටිනාකම් මත | 2020.12.31 දිනට රාජ්‍ය ආයතන සඳහා සිදු කරන ලද කාර්යයවල තථ්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත වටිනාකම අතර වෙනස රු. 43,421,695.18 ක් සහ 2021.12.31 දිනට එම වෙනස රු. 36,811,013.41 ක් විය. හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා | මෙම කාර්යයන් ඉන්වොයිස් වටිනාකම් මත අගය කර ඒ අනුව ඒවා සටහන් කළ යුතුය. ගනුදෙනු ආරම්භයේදී |

| | | |
|---|---|---|
| පදනම්ව ගිණුම්ගත කිරීම වෙනුවට, පිරිවැය අනුව තක්සේරු කර තිබූ අතර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු ශේෂය සහ රඳවාගත් ඉපයීම් රු. මිලියන 36.8 ක් බැගින් අඩුවෙන් දැක්වුණි. | විවිධ උත්සාහයන් දැරීමෙන් පසුව පවා මෙම ශේෂයන් දීර්ඝකාලීනව හිඟව පැවතීම හේතුවෙන් මෙම හිඟ ශේෂවලින්, ආගමික උත්සව සහ ක්‍රීඩා අවස්ථා වැනි වෙනත් කටයුතු සඳහා ජංගම ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් ආගමික ආයතනවලින් ලැබිය යුතු මුළු මුදල වන රු. 33,784,518.05 ක් කපා හැරීමට 2021 අගෝස්තු මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. | ලැබිය යුතු මුදල් එකතු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) 2016 වර්ෂයේ බදු ලෙස මහා භාණ්ඩාගාරය වෙත රු. මිලියන 5,000 ක් ගෙවා තිබූ අතර ඒ අතුරින් රු. මිලියන 2,000 ක් රඳවා ගත් ඉපැයීම්වලට අය කර තිබුණු අතර රු. මිලියන 500 ක් සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණ ගාස්තු ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කර තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 2,500 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ණයගැතියන් ලෙස දැක්වේ. ඒ අනුව, මණ්ඩලය එම ගනුදෙනුවේ ස්වභාවය පැහැදිලිව වටහාගෙන ඒවා සැලකිල්ලට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | 2019.10.16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක. PDE/I/CEB/2/11/(iii) ලිපිය මත පදනම්ව, 2019 වර්ෂයේදී, මෙම ගෙවීම භාණ්ඩාගාරයට ගෙවන ලද "කළමනාකරණ ගාස්තු" ලෙස සලකනු ලැබූ අතර, 2017 වසරේ සිට වසර 10 ක කාල සීමාවක් තුළ ක්‍රමක්ෂය කරයි. | 2016 වර්ෂයේදී බද්දක් ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවූ රු. මිලියන 5000 ක මුදල රඳවාගත් ඉපයීම්වලට අය කළ යුතුය. |
| (උ) සම්පූර්ණ කරන ලද රු. බිලියන 6.34 ක් වටිනා කාර්යයන් 8,094 ක් බෙදාහැරීම් අංශ 4 හි වත්කම් ගිණුම්වලට මාරු නොකර කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. තවද, එම වත්කම්වලට අදාළ ක්ෂයවීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | සම්පූර්ණ කරන ලද සියලුම කාර්යයන් සම්පූර්ණ කිරීමේ වාර්තා ලැබුණු විට වත්කම්වලට මාරු කරනු ලැබේ. 2022 වර්ෂයේදී රු. මිලියන 2,643.11 ක් වටිනා කාර්යයන් වත්කම් වෙත මාරු කර ඇත. දිගුකාලීනව පවතින ප්‍රාග්ධන කාර්යයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ භාරදීම සඳහා පළාත් මට්ටමේ කමිටු පත් කර ඇත. එබැවින්, මේ වන විට මෙම අංශවල දිගුකාලීනව පවතින කෙරීගෙන යන වැඩවල සැලකිය යුතු අඩුවීමක් 2021 ට සාපේක්ෂව දැකිය හැකිය. | සම්පූර්ණ කරන ලද කාර්යයන් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම වීමෙන් පසුවද ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල කෙරීගෙන යන වැඩ ගිණුමේ තවදුරටත් ඇතුළත් වී තිබුණි. තවද, ව්‍යාපෘතිය නිම කර දින සිට එම වාහනවලට අදාළ ක්ෂයවීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (අදියර-02) සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන 06 ක හිමිකාරිත්වය 2021 දෙසැම්බර් 31 වනදා දක්වාත් මණ්ඩලය වෙත පවරා දී නොමැත. වාහනවල අයිතිය මණ්ඩලයට පැවරීමෙන් පසු ප්‍රාග්ධනිත කිරීම සිදුවනු ඇත. | එම වාහන ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (එ) බෙදාහැරීමේ අංශය, 4 ට අදාළ වීදි ආලෝකකරණ නඩත්තු වියදම්වලින් අය කර ගත නොහැකි වූ රු. මිලියන 32.32 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ප්‍රතිපාදන සලසා නොතිබුණි. | වීදි ආලෝකකරණ නඩත්තු වියදම්වලට අදාළ රු. මිලියන 32.32 ක් වූ ආපසු අයකරගත නොහැකි ගිණුම් සඳහා දැනටමත් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. | ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ඒ) අසාමාන්‍ය බැර ශේෂයන් හිලව් කිරීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂය රු. මිලියන 41.48 කින් අඩුවෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල අයිතම ඉදිරිපත් කිරීම නිවැරදිව සිදු කළ යුතුය. |
| (ඔ) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්ම වූ රු. බිලියන 2.7 ක් වූ ආර්ථික සේවා ගාස්තුව (ඊ.එස්.සී) මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂයේ අලාභය රු. බිලියන 1.13 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර රඳවාගත් ඉපයීම් රු. බිලියන 1.622 කින් වැඩියෙන් දක්වා තිබුණි. | තත්ත්වය පැහැදිලි කරමින් රු. බිලියන 2.7 ක මුදල කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | හිමිකම් පෑමට නොහැකි අයිතම සඳහා ගිණුම්කරණ ප්‍රතිකර්ම නියමිත වේලාවට සිදු කළ යුතුය. |
| (ඕ) නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග නොගෙන රු. මිලියන 871.2 ක මාර්ගස්ථ තොග අවුරුදු 1 සිට 5 දක්වා කාල පරාසයක් තිස්සේ මාර්ගස්ථ තොග ගිණුමේ පවතී. තවද, රු. මිලියන 5.1 ක් වූ අසාමාන්‍ය බැර ශේෂයක් මාර්ගස්ථ තොග ගිණුමේ පවතී. මාර්ගස්ථ තොග ශේෂ සම්බන්ධයෙන් ලේඛනගත සාක්ෂි විගණනයට ලබා දී නොතිබුණි. | සමහර ශේෂයන් ගැලපීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර මාර්ගස්ථ තොග ගිණුම නිරවුල් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | එකී කාරණය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ක) දෙහිවල ගල්කිස්ස විදුලිය බෙදාහැරීමේ සංවර්ධන ව්‍යාපෘතියේ වියදම වූ රු. මිලියන 39 ක් 2010 වර්ෂයේ සිට ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. | ප්‍රාග්ධනිත කිරීම සඳහා බෙදාහැරීමේ අංශය, 4 විසින් කෙරීගෙන යන වැඩ ශේෂය දැනටමත් ව්‍යාපෘති අංශය වෙත මාරු කර ඇත. | කෙරීගෙන යන වැඩ ශේෂය ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ග) අපහරණය කරන ලද රු. මිලියන 14 ක් වූ ස්ථාවර වත්කම් සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග හඳුනා ගැනීමටත්, 2022 වසර අවසානයේදී මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගිණුම් සටහන් යෙදීමටත් ක්‍රියාමාර්ග ගෙන ඇත. | එකී කාරණය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ට) වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගැනීම, නිවැරදි කිරීම සහ වලක්වා ගැනීමට හැකිවනු පිණිස අවශ්‍ය වන සුදුසු අභ්‍යන්තර පාලනය පද්ධතියක් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමට මණ්ඩලය අසමත් වීම | ඉදිරියේදී එවැනි යළි පිළියෙල කිරීම් අවම කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. මණ්ඩලයේ මෙහෙයුම් සහ ගණුදෙණුවල සංකීර්ණත්වය හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවලින් තොර බව සහතික කිරීම සඳහාත්, පෙර වසරවල යම් සාවද්‍ය ප්‍රකාශන සිදුවී ඇත්නම් ඒවා | සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කර පවත්වාගෙන යා යුතුය. |

| | | |
|---|---|---|
| හේතුවෙන් 2013 වර්ෂයේ සිට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව යළි පිළියෙල කර තිබුණි. | නිවැරදි කර ගැනීම සඳහාත් මූල්‍ය ප්‍රකාශන යළි පිළියෙල කිරීමට අවශ්‍ය වන අවස්ථා පවතී. | |
| (ඩ) නිරවුල් කිරීම වෙනුවට අන්තර් අංශවල ජංගම ගිණුමේ ශේෂයන් ණයගැති පාලන ගිණුමට මාරු කිරීම හේතුවෙන් රු. මිලියන 557.94 ක හර ශේෂයක් සහ රු. මිලියන 556.81 ක බැර ශේෂයක් 2002 වර්ෂයේ සිට නිරවුල් නොකර මූල්‍ය ප්‍රකාශනවල පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා එය වෙළඳ ණයගැති ගිණුමට මාරු කර ඇත. මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ණ) 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 19/2622/113/074 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලක්විජය බලාගාර ව්‍යාප්ති ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 167.31 ක් වියදම් කිරීමෙන් අනතුරුව, 2021 ජූලි 26 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව 2021 ඔක්තෝබර් 26 දින ව්‍යාපෘතිය වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. එසේ වුවද, එම මුදල කපා හැරීමට කිසිදු ප්‍රතිපාදනයක් 2021 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි. | දරන ලද වියදම් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව ගිණුම්වල ප්‍රතිපාදනයක් ඇතුළත් කළ හැකිය. | එම මුදල කපා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ත) ලක්විජය විදුලි බලාගාරයේ වත්කම් ලේඛනයේ වාහන 28 ක වටිනාකම සහ එහි සමුච්චිත ක්ෂයවීම් සටහන් කර නොතිබුණි. මේ නිසා, එම වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | මෙම වාහන ලක්විජය විදුලි බලාගාරයේ අදියර I සහ II ව්‍යාපෘතිය යටතේ ලැබී ඇත. 2021 දෙසැම්බර් 31 දිනට වාහන වටිනාකම් සඳහා මාරු වවුචර ලක්විජය විදුලි බලාගාරය වෙත ලැබී නැත. | ගැටලුව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ද) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පිහිටා තිබූ රජයට අයත් ඉඩම මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මණ්ඩලයේ වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, මණ්ඩලයේ වත්කම් රු. මිලියන 105.62 කින් වැඩියෙන් දැක්වුණි. | අදාළ හිමිකම් ලේඛනය නිකුත් නොකර දිගුකාලීන පදනමින් ඉඩම බදු දීමට කටයුතු කරන ලෙස ඉඩම් කොමසාරිස්වරයා කොළඹ ප්‍රාදේශීය ලේකම්වරයාට දන්වා ඇත. කෙසේ වෙතත්, මණ්ඩලය දේපලේහි අයිතිය සඳහා මිස බදු ගැනීමට කැමැත්තක් නොදක්වයි. තවද, 2022-08-23 දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් සහ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් සමඟ රැස්වීමක් පවත්වා ඇත. මෙම කාරණය කඩිනමින් විසඳා ගැනීමට එම රැස්වීමේදී තීරණය කර ඇත. | ඉඩමේ අයිතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල එදිනට ලැබිය යුතු ලෙස දැක්වෙන ශේෂය අතර රු. මිලියන 1,235 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ඉහත ශේෂය තුළ 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 753.61 ක විවාදිත ශේෂයක් පැවතී අතර මෙය 2013 සිට අඛණ්ඩව විගණන වාර්තාවල අවධාරණය කර තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 469.11 ක නොසැසඳු ශේෂයක් පැවතුණි. | මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ භාණ්ඩාගාරයේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමේ දී රු. මිලියන 753.61 ක විවාදිත මුදල පිළිබඳව සාකච්ඡා කර ඇති අතර එය විසඳීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉන්වොයිසි පියවන විට ප්‍රමුඛතාවය මත ප්‍රමාද වූ පොලී හිලව් කිරීම මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඒකපාර්ශ්විකව සිදු කරන ලද පරිවයන් හි වෙනසක් හේතුවෙන් 2021 දෙසැම්බර් මාසයේ දී සහ මේ දක්වා රු. මිලියන 469.11 ක වෙනසක් පවතී. | වෙනස්කම් සැසඳීමට කටයුතු කළ යුතුය. |
| (ආ) බෙදාහැරීම් අංශය 1 හි හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ණයගැති ශේෂයක් 2012 වසරේ සිට අයනොවී පවතී. කෙසේ වෙතත්, එයින් රු. මිලියන 181.42 ක් පැහැදිලි කිරීමක් නොමැතිව බෙදාහැරීමේ අංශය 3 වෙත මාරු කර තිබුණි. | රු. මිලියන 423.76 ක ණය ගැති ශේෂය අතුරින්, රු. මිලියන 241.22 ක් පොත්වල පවතී. ශේෂය නිරවුල් කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් සිටී.<br>පවතින තොරතුරුවලට අනුව, විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේදී එම මුදල මාරු කර නොතිබූ බැවින්, රු. මිලියන 423 ක ශේෂය 2015 වර්ෂයේ සිට අතිරේක මූල්‍ය කළමනාකාර (AFM) පිරිවැය මධ්‍යස්ථානයේ පොත් යටතේ පවතී. කිසියම් ශේෂයක් ඔවුන්ට අයත් දැයි පරීක්ෂා කරන ලෙස සියලුම ප්‍රාදේශීය AFMMs වෙත දැනුම් දී ඇති අතර ප්‍රාදේශීය AFMMs වෙතින් ලැබෙන ප්‍රතිචාරවලින් පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | සෑම අංශයකම පද්ධති ශේෂයන් සමඟ ලෙජර ශේෂයන් සෑම මාසයකදීම සංසන්දනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) බෙදාහැරීම් අංශය 1 හි සාමාන්‍ය ණය ගැතියන් සම්බන්ධව පද්ධතිය ජනනය කරන ලද ශේෂයන් සහ ලෙජර් ගිණුම් ශේෂයන් අතර වෙනස්කම් පවතී. ඒ අනුව, පද්ධතිය විසින් ජනනය කරන ලද ශේෂයන් සහ ලෙජර් ගිණුම් ශේෂයන් කාලීනව සංසන්දනය නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය ණය ගැතියන්ගේ රු. මිලියන 6.77 ක වෙනසක් සමාලෝචිත වර්ෂය තුළදී නිරීක්ෂණය විය. | වෙනස සැසඳීම සඳහා, බිල්පත් පද්ධති ශේෂය සහ ලෙජර් ශේෂය අතර සැසඳීම සිදු කරන අතර, එක් එක් බෙදාහැරීමේ අංශයන් විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳුම් ප්‍රකාශය සපයයි. | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) 2021 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 297.33 ක හර ශේෂයක් සහ රු. මිලියන 1,409.57 ක බැර ශේෂයක් පැවතුණි. කෙසේවෙතත්, නොසැසඳු ශේෂ සංසන්දනය කිරීම් විගණනයට ලැබී නොතිබුණි. එම නිසා, එකතු කිරීමේ පාලන ගිණුමේ ඇති ශේෂයන්හි නිරවද්‍යතාවය සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය. හඳුනා නොගත් ආරම්භක ශේෂය වූ රු. මිලියන 166.45 ක් එකතු කිරීමේ පාලන ගිණුමට ඇතුළත් කර තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | අදාළ සංසන්දනය කිරීම් ඉදිරියේදී ඉදිරිපත් කෙරේ. | සෑම අංශයකම පද්ධති ශේෂයන් සමඟ ලෙජර ශේෂයන් සෑම මාසයකදීම සංසන්දනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 1998 සිට 2021 දක්වා කාලය තුළදී එකතු කරන ලද රු. මිලියන 68.99 ක් නිරවුල් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගෙන අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කර තිබුණි. | පාරිභෝගික පැමිණිලි ලැබීමෙන් පසු අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කළ හැක. පාරිභෝගිකයා නිවැරදි පාරිභෝගික ගිණුම් අංකය දැනුම් දුන් විට අදාළ මුදල පාරිභෝගික ගිණුමට මාරු කළ හැකිය. ඊට අමතරව, එකතු කිරීමේ නියෝජිතයින්ගෙන් විස්තර ලබා ගනිමින් අවිනිශ්චිත එකතු කිරීම් නිරවුල් කිරීමට පසු විපරම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි. | දීර්ඝකාලීන හඳුනා නොගත් ලැබීම් සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) මණ්ඩලය විසින් පාරිභෝගිකයින් සඳහා වැරදි ගාස්තු ක්‍රමවේදයක් යෙදීම හේතුවෙන් 2019 වසරේ සිට ලැබිය යුතු රු. මිලියන 38.76 ක මුදලක් අය නොවී පැවතුණි. | විගණන කමිටු රැස්වීමේදී මෙය අවධානට යොමු කර ඇති අතර 2021 දෙසැම්බර් 28 දින පැවති විගණන කමිටු රැස්වීමේ තහවුරු කරන ලද රැස්වීම් වාර්තාව අනුව, ඒඊඑස් කැලණිතිස්ස පුද්ගලික සමාගමට අදාළ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම සහ තොග ගිවිසුම සම්බන්ධයෙන් සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ කමිටු වාර්තාව අවසන් කරන ලෙස විගණන කමිටුව නියම කළේය. කමිටු වාර්තාව මෙතෙක් ඉදිරිපත් කර නොමැත. | එම කරුණ විධිමත් කර කඩිනමින් වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනුවේ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය සහ 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට | 2022 ජූලි 27 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි කාර්ය මණ්ඩල දීමනාව වැටුපෙන් සියයට 65 කට සීමා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කර ඇත. | කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේදී චක්‍රලේඛයේ සහ අමාත්‍ය මණ්ඩල තීරණයේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට වරින් වර විවිධ කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණි. විගණන නියැදි පරීක්ෂණවලදී, එවැනි දීමනා එකතුව රු. මිලියන 2,134.9 ක් සහ රු. මිලියන 1,544.4 ක් පිළිවෙලින් 2021 සහ 2020 වර්ෂයන්හිදී ගෙවා තිබු බව හෙළිදරව් විය. තවද, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයේ සහ අංක BM/2021/22/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ විධිවිධානවලට පටහැනිව, සේවකයින් 323 දෙනෙකු සඳහා ගෙවා ඇති දීමනා ඔවුන්ගේ වැටුපෙන් සියයට 65 ඉක්මවා තිබුණි. | | |
| (ආ)1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සියයට 10 සිට සියයට 14 දක්වා පොලී අනුපාත යටතේ වාහන ණය ලබා දිය යුතුය. කෙසේවෙතත්, මණ්ඩලයේ දැඩි ද්‍රවශීලතා ගැටලු සලකා බැලීමකින් තොරව මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයක් යටතේ වාහන ණය එහි සේවකයන් වෙත ලබා දී තිබුණි. | සඳහන් කරන ලද නිරීක්ෂණ ආයතනයේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම සඳහා ඔවුන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභ හා සම්බන්ධ වේ. තවද, මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම පනත මගින්ම සපයයි. | පනතේ බලතල ක්‍රියාත්මක කිරීමේදී මණ්ඩලය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ඇ) 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තියේ දක්වා ඇති පරිදි මණ්ඩලය පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොතිබුණි. 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය මඟින් කරන ලද ගණනය කිරීම්වලට අනුව ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 1,357.60 ක් වූ අතර ඒ අනුව 2021 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්චිත පොළිය රු. මිලියන 8,089.50 ක් විය. | විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද ඉල්ලීම සඳහා විදුලිබල අමාත්‍යාංශයේ ප්‍රතිචාරය බලාපොරොත්තුවෙන් සිටී. තවද, මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය වැඩිදියුණු වූ පසු පාරිභෝගික සුරකුම් තැන්පතු සඳහා පොලී ගෙවීම ආරම්භ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ඉල්ලා කෙටුම්පත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සකස් කර ඇත. | පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) අදාළ පාර්ශවයන් එනම් සේවායෝජක සහ සේවක සංගම් විසින් අත්සන් කර නොතිබූ බැවින් නීත්‍යානුකූල ලියවිල්ලක් බවට පත් නොවූ කෙටුම්පත් සාමූහික ගිවිසුම් මත පදනම්ව 2021 වර්ෂයේදී මණ්ඩලය විසින් සේවක වැටුප් සියයට 25 කින් වැඩි කර තිබුණි. ඒ අනුව, එම බලයනොලත් ගෙවීම හේතුවෙන් මණ්ඩලයට සිදුවූ අහිතකර බලපෑම ආසන්න වශයෙන් රු. බිලියන 9.6 කි. | මේ සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩලයේ සමාන්‍යාධිකාරී වෙත උපදෙස් දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත මණ්ඩලයේ සමාන්‍යාධිකාරී විසින් අදාළ චක්‍රලේඛය නිකුත් කර ඇත. තවද, සාමූහික ගිවිසුම කඩිනමින් අත්සන් කරන ලෙස සියලුම වෘත්තීය සමිති දැනුවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන ඇත. | සාමූහික ගිවිසුම නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතය පහත සඳහන් නිරීක්ෂණයන් මත පදනම්ව මා විසින් ප්‍රකාශ කරන ලදි.

**(අ) සී/ස ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 12) හි 88 වන ඡේදයට අනුව, එකතු කළ අගය මත බදු තක්සේරු කිරීම් සම්බන්ධයෙන් 2017/2018 සහ 2018/2019 තක්සේරු වර්ෂ සඳහා ගෙවිය යුතු අතිරේක බදුවලට අදාළව රු. මිලියන 287.1 ක් සහ ඒ මත ගෙවිය යුතු දඩ මුදල්වලට අදාළව රු. මිලියන 220.6 ක් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි. | ලද එකතු කළ අගය මත බදු තක්සේරුව සඳහා අභියාචනයක්ද සමඟ සංශෝධිත වැට් බදු වාර්තා 04 ක් **ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම** විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා සාකච්ඡා සිදු වෙමින් පවතී. බදු උපදේශකවරයාගේ සහාය ඇතිව 2022/06/06 දින පළමු රැස්වීම සාර්ථකව සිදු කර ඇත. අවශ්‍ය නම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, ඉදිරි මූල්‍ය වර්ෂයේදී අනාවරණය කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| ii. නැවිගත තොග 154 ක අවිනිශ්චිත ගිණුම්වලට අදාළව රු. මිලියන 33.3 ක් සහ මණ්ඩලයේ ප්‍රසම්පාදන ගල් අඟුරු අවසන් ශේෂයෙන් ලැබිය යුතු අත්තිකාරම්වලට අදාළව රු. මිලියන 1.8 ක් සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් පියවා නොතිබුණි. | <u>අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂයේ අන්තර්ගතය:</u><br>මණ්ඩලයෙන් ලැබිය යුතු රු.4,323,787.00: 2017 දී මණ්ඩලය සමඟ ගිණුම පියවීමෙන් පසු මෙම මුදල ඉතිරිව ඇත. මූලාශ්‍රය/සම්භවය සොයා ගැනීමට මෙම ශේෂය තවදුරටත් විමර්ශනය කෙරේ.<br><u>2021 වර්ෂය තුළ මාරු කළ මුදලේ අන්තර්ගතය:</u><br><u>රු.30,757,506</u> | සමාගම විසින් ශේෂවල මූලාරම්භය සොයා බලා අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මර්කේටර් වෙත ගෙවිය යුතු මුදල ගිණුම්කරණයේ ප්‍රතිඵලයකි. දැනටමත් අදාළ මුදල මණ්ඩලයෙන් ලැබී තිබුණත් එය ගිණුම්වල පිළිබිඹු නොවීම නිසා එය අවිනිශ්චිත ගිණුමට හරකර තබාගෙන ඇත. 2022 මූල්‍ය වර්ෂයේ අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීම සඳහා මූලාශ්‍රය/සම්භවය සොයා ගැනීමට තවදුරටත් විමර්ශනය කෙරේ. | |
| iii. | ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කිරීමේ සාම්ප්‍රදායික ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වටිනාකමට එකතු කරන ලදි. කෙසේ වෙතත්, සමාගම විසින් රු. මිලියන 5,324.4 ක් වූ සියයට 10 ක අංකිත මිල ආදායමට එකතු කර තිබූ අතර පසුව සමාගම විසින් ණයගැතියන්ට එය වට්ටමක් ලෙස ලබා දී විකුණුම් පිරිවැයට ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | මණ්ඩලය වෙත වැට් ඉන්වොයිසි නිකුත් කිරීමේදී රේගු ආන්තිකය පිරිවැයට එකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් **ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම** වෙත නියෝගයක් ලබා දී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ සහභාගීත්වයෙන් 2018 ජුනි 28 වන දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකින් අනතුරුව මෙම මිලකරණ යාන්ත්‍රණය සම්මත කර ඇත. දේශීය ආදායම් නිලධාරියා මණ්ඩලයට ලැබෙන ඉන්වොයිසි මත ලංකා ගල්අඟුරු සමාගමෙහි වැට් බද්ද සඳහා වන මූලික අගය රේගු අරමුණු සඳහා වන අගයට වඩා අඩු විය නොහැකි බව පවසා ඇත. එබැවින් සියයට 10 එකතු කරනු ලබන්නේ දේශීය ආදායම් නිලධාරියාගේ නියෝගය මත පමණි. මණ්ඩලය මෙම නියෝගය අභියෝගයට ලක් කර ඔවුන්ගේ 2018-09-07 දිනැති ලිපිය මගින් දේශීය ආදායම් වෙත ලියා ඇති අතර එයට ප්‍රතිචාරය තවමත් ලැබී නොමැත. | මෙම කාරණය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝග ලබා ගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය. |
| iv. | මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට මණ්ඩලයෙන් ලැබිය යුතු රු. මිලියන 197.6 ක වැට් බදු සහ වෙනත් ලැබිය යුතු දෑ මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. තවද, මණ්ඩලය සිය මූල්‍ය ප්‍රකාශනවල මෙම වගකීම හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව, එම මුදල්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. | ගෙවිය යුතු මුදල් තහවුරු කිරීමෙන් පසු ශේෂය තහවුරු කිරීම **ලංකා** ගල්අඟුරු (පුද්.) **සමාගමට** නියමිත වේලාවට යවන ලෙස අදාළ නිලධාරීන්ට දැනුම් දීමට කටයුතු කර ඇත. | සමාගම මණ්ඩලය සමග සාකච්ඡා කර වහාම ගැටළුව විසඳා ගත යුතුය. |
| v. | සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු. මිලියන 22.5 ක් වූ කළමනාකරණ ගාස්තු වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පවතී. කෙසේවෙතත්, මේ | 2020 ජුනි 17 වන දින ලක් විජය විදුලි බලාගාර කළමනාකරුගේ කාර්යාලයේ පැවති රැස්වීමකට අනුව, "මණ්ඩලය සමග ව්‍යාපාරික ගණුදෙනුවකට අදාළව සියළුම වියදම් සිදු කර බව" දක්වමින් 2016, 2018 සහ 2019 වසර | සමාගම දිගුකාලීන හිඟ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධව කිසිදු ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි. | සඳහා ලැබිය යුතු හිඟ කළමනාකරණ ගාස්තුව සඳහා සාධාරණීකරණය කිරීමේ ලිපියක් එවන ලෙස අතිරේක සමාන්‍යාධිකාරි (ජී) විසින් ලංකා ගල්අඟුරු සමාගමෙන් ඉල්ලා සිටින ලදි. | |
| vi. | පවතින තොරතුරුවලට අනුව, 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් නොකිරීම මත රු. මිලියන 205 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට සමාගම විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. 2019 දී ගෙවන ලද දඩ මුදල අදාළ වර්ෂයේ වියදමට ගිණුම්ගත කිරීම වෙනුවට ශ්‍රී ලංකා රේගු වැට් ගිණුමට, වැට් පාලන ගිණුමට සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුමට ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රඳවා ගත් ඉපැයීම් රු. මිලියන 205 කින් වැඩියෙන් දැක්වුණු අතර ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම, වැට් පාලන ගිණුම සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුම පිළිවෙලින් රු. මිලියන 158.2 කින්, රු. මිලියන 40 කින් සහ රු. මිලියන 6.8 කින් අඩුවෙන් දැක්වුණි. | ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයට අනුව, ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු අගයන් ප්‍රකාශනය කර නොමැත. එම කාලය තුළ, ලංකා නැව් සංස්ථාව විසින් එක් නැව්ගත කිරීමකට රු. 1,000,000 ක ගාස්තුවක් යටතේ රේගු ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හසුරුවා ඇති අතර ඉහත වැරදි ප්‍රකාශනය මත ශ්‍රී ලංකා රේගුව **ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම** වෙත රු. 205,000,000 ක දඩයක් පනවා තිබුණි. මෙම ගෙවීමෙන් පසු අවසන් වැට් බදු ගෙවීමක් නොමැති බව ශ්‍රී ලංකා රේගුවේ විමර්ශන නිලධාරීන් ලංකා ගල්අඟුරු සමාගමේ නිලධාරීන්ට දන්වා තිබුණි. තවද, ඉහත වැරදි ප්‍රකාශනය හේතුවෙන් තථ්‍ය දඩය රු. 6,843,417.00 ක් ලෙස **ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම** විසින් හඳුනාගෙන ඇති අතර ලංකා නැව් සංස්ථාවේ වගකීමට එරෙහිව හර කර ඇත. | සමාගම විසින් මෙම ගෙවීම දඩ වියදම් ලෙස සටහන් කළ යුතු අතර මෙම ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. |
| vii. | සී/ස ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී.එල්) හරහා ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැනි ලිමිටඩ් මඟින් (ටී.අයි.එස්.සී.එල්) රු. මිලියන 539.1 ක දිගු කාලීනව හිඟ ලැබිය යුතු ශේෂය අය කර ගැනීමට සමාගම සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. තවද, ටී.අයි.එස්.සී.එල්/සී.එස්.සී.එල් විසින් මෙම ශේෂය තහවුරු කර නොතිබුණි. එම නිසා, ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් බේරුම්කරණය ඉහළ මට්ටමේ කමිටුවක් විසින් හසුරුවා ඇත. ණය බොල් ණය බව කමිටුවේ මතය වී නොමැති අතර ගල් අඟුරු සැපයීම හරහා ගෙවිය යුතු මුදල් පියවීමට ගැණුම්කරු කැමැත්ත පළ කර ඇත. අප සතුව ඇති තොරතුරුවලට අනුව, බේරුම්කරණ යෝජනාව අමාත්‍ය මණ්ඩලයට තීරණය කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. ලංකා නැව් සංස්ථාව (ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් ලිමිටඩ්) වෙතින් ලැබිය යුතු හිඟ මුදල්වල වර්තමාන තත්ත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර අමාත්‍ය මණ්ඩලය විසින් ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සමඟ සාකච්ඡා කිරීමට භාණ්ඩාගාරය (සභාපති), ලංකා නැව් සංස්ථාව, ලක්විජය බලාගාරය සහ **ලංකා** ගල්අඟුරු (පුද්.) **සමාගම** නියෝජනය වන සිව් පුද්ගල කමිටුවක් පත් කර ඇත. තවද, ඉදිරිපත් කිරීමට නියමිත එම කමිටුවේ නිර්දේශ වරාය හා නාවික අමාත්‍යාංශය | අයකිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට සමාගම පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | හරහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙසද අමාත්‍ය මණ්ඩලය උපදෙස් දී ඇත. | |
| viii. රු. මිලියන 18 ක් වූ විවිධ ණයගැති ශේෂය, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් හි රු. මිලියන 1.1 ක ලැබිය යුතු ශේෂය, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් හි රු. මිලියන 85.9 ක වෙළඳ ණය හිමියන් සහ ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 ක් වන රු. මිලියන 8 ක් තහවුරු කිරීමට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි. | i. විවිධ ණයගැතියන් - රු. 18,075,802<br>රු. 17,839,949 ක් වූ ආපසු අයකරගත නොහැකි ජාතික ගොඩනැගිමේ බදු සහ වාරය අධිකාරීයේ බදුවලින් එම මුදල සමන්විත වන බව මූලික විමර්ශනවලින් හෙළි විය. මූලාශ්‍රය/සම්භවය සොයා ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ.<br><br>ii. ලැබිය යුතු මුදල් -රු.1,115,987<br>නෝබල් රිසෝසස් වෙත රු. 85,887,776 ක ණය ශේෂයක් ඇති අතර මෙම ණයගැති ශේෂය ඊට එරෙහිව පියවීමට කටයුතු කරනු ඇත.<br><br>iii. වෙළඳ ණයහිමියන් -රු.85, 887,776<br>ණයවර ලිපි වලංගු කාලය අවසන් වීම හේතුවෙන් ණයහිමියා විසින් අඩුවෙන් ලබා ගන්නා ලද මුදලකින් මෙය ප්‍රධාන වශයෙන් සමන්විත වේ.<br>iv. ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 - රු. 8,048,531<br>2015/16 වාරයට අදාළ නැව් 17 ක් සඳහා ගොඩබෑමේ වරායේ කෙටුම්පත් සමීක්ෂණ (Draft Survey) ගාස්තු මේ තුළ ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | සමාගම ලැබිය යුතු ශේෂයන් පිළිබඳ මූලාශ්‍ර සොයා බලා ලැබිය යුතු මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතු අතර ණයහිමියන්ගේ ශේෂයන් තහවුරු කර අවශ්‍ය දේ කළ යුතුය. |
| ix. සමාගම විසින් අංක 123 දරන නැව්ගත තොගය සඳහා රේගු වැට් බදු වශයෙන් රු. මිලියන 136.3 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගුවට භාණ්ඩ ප්‍රකාශයට පත් කිරීමේ ලේඛනයට (Cusdec) අනුව, තථ්‍ය වැට් බදු මුදල රු. මිලියන 107 ක් විය. ඒ අනුව, සමාගම වැඩිපුර රු. මිලියන 29.3 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | ලංකා නැව් සංස්ථාව විසින් කරන ලද වැරදි ප්‍රකාශනයක් හේතුවෙන් ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම ශ්‍රී ලංකා රේගුවට නැව් තොග අංක 123 සඳහා රු. 29, 266,966 ක වැඩිපුර වැට් බදු ගෙවා ඇත. ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම විසින් දැනටමත් මුදල් ආපසු ගෙවීමේ හිමිකම් පෑමක් ගොනු කර ඇති අතර, ආපසු ගෙවීම සම්පූර්ණ කිරීමට හෝ ලංකා ගල්අඟුරු (පුද්.) සමාගමෙහි හිඟ රේගු ශේෂයන්ට එරෙහිව පියවීමට සුදුසු විධිවිධාන පිළිබඳව රේගු දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී. ආපසු ගෙවීමේ හිමිකම් පෑම ලැබෙන තෙක් ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම විසින් එම මුදලට සමාන මුදලක් ලංකා නැව් සංස්ථාවේ හිඟ මුදල්වලින් රඳවා ගෙන ඇත. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසු සමාගම වහාම ගැටලුව විසඳා ගත යුතුය. |

| | | |
|---|---|---|
| x. සී/ස ලංකා ගල්අඟුරු (පුද්.) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂය සහ එදිනට ලංකා නැව් සංස්ථාව විසින් තහවුරු කරන ලද ශේෂය අතර රු. මිලියන 4 ක හඳුනා නොගත් වෙනසක් පැවතුණි. කෙසේ වෙතත්, එම වෙනස සැසඳීමට සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 වන දිනට ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂයේ වෙනස සඳහා අයිතම හඳුනා ගනිමින් ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම විසින් සැසඳුම් ප්‍රකාශයක් සකස් කර ඇත. බොහෝ අයිතම ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම විසින් සාධාරණ හේතු මත ගිණුම්ගත කර නොමැති අතර සටහන අංක 24, "බැඳීම් සහ අසම්භාවයන්" යටතේ අනාවරණය කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනට වසර අවසාන ශේෂයන් හි පවතින නොගැලපීම් සහ හඳුනා නොගත් වෙනස්කම් විසඳීමට වර්තමානයේදී ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම සහ ලංකා නැව් සංස්ථාව සාකච්ඡා කරමින් සිටී. | සමාගම හඳුනා නොගත් වෙනස හඳුනාගෙන ඒ අනුව වාර්තා කළ යුතුය. |
| xi. සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු. මිලියන 2 ක ගෙවිය යුතු ශේෂයට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ අනෙකුත් අදාළ සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි. | ඉහත ගෙවිය යුතු ගිණුම් (ගිණුම් කේත අංක: 20000), 2018 සහ ඊට පෙර වර්ෂවල සිදු කරන ලද වැරදි ගිණුම් සටහන් හේතුවෙන් සිදු විය. ඉහත දෝෂය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය සටහන් සිදු කිරීමට පියවර ගනු ලැබේ. | විගණන නිරීක්ෂණයට ඇතුළත් නොවූ ගෙවිය යුතු ශේෂයක් පිළිබඳව කළමනාකාරිත්වය අදහස් දක්වා තිබූ අතර සමාගම විසින් ශේෂයේ මූලාරම්භය සොයා බැලිය යුතුය. |

**(ආ) සී/ස ලංකා විදුලි (පුද්.) සමාගම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| i. 2021 දෙසැම්බර් 31 දිනට ලංකා බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍ය කොටස් සඳහා කරන ලද රු. මිලියන 5 ක ආයෝජනයට අදාළ කොටස් සහතික හෝ වෙනත් ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි. | මේ කාරණය නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. ඔවුන් කලින් කලට යම් තොරතුරු/පැහැදිලි කිරීම් ඉල්ලා ඇති අතර සමාගම එම තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දීමට කටයුතු කරමින් සිටී. නීතිපති දෙපාර්තමේන්තුවේ අවසන් උපදෙස් මත මෙම සමාගමට එරෙහිව නඩු පැවරීමට අපේක්ෂා කෙරේ. | ආයෝජනයේ වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. පාරිභෝගිකයින්ගෙන් එකතුකර ගත් හඳුනා නොගත් (අනෙකුත් ණය හිමියන්) රු. මිලියන 14.7 ක් ප්‍රතික්ෂේප කරන ලද ගිණුමෙන් මාරු කර ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණය හිමියන්ගේ ශේෂය යටතේ පෙන්වා තිබුණි. ඒ අතරින් රු. මිලියන 3 ක් 2016 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනවිත් තිබුණි. | එකතු කිරීමේ නියෝජිතයින් සහ බැංකු සමඟ සම්බන්ධීකරණය කරමින් භාණ්ඩාගාර අංශය මගින් මෙම කරුණ නිරවුල් කරමින් පවතී. මෙම ගැටලුව අවම කිරීම සඳහා ලෙකෝ විසින් අදාළ සියලු උත්සාහයන් ගෙන ඇත. මේ වන විට රු. 1,746,780.92 ක් හඳුනාගෙන නිරවුල් කර ඇත.<br>මෙය අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, තැන්පත්කරුවන් විසින් සිදු කරන ලද වැරදි සහ එකතුකරන්නන්ගේ වැරදි/අතපසුවීම් හේතුවෙන් බැංකු ගිණුම් කිහිපයක හඳුනා නොගත් එකතු කිරීම් පවතී. බැංකු සැසඳුම් සකස් කරන විට, මෙම හඳුනා නොගත් එකතු කිරීම් නිරවුල් කිරීම සඳහා අදාළ එකතුකරන්නන් සමඟ නැවත පරීක්ෂා කරයි. | i. ලෙජර් ගිණුම්වල ඇති නොසැසඳුනු ගනුදෙනු නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.<br>ii. හඳුනා නොගත් එකතු කිරීම් අවම කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කළ යුතුය. |

| | | |
|---|---|---|
| iii. 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයෙන් විවිධ සේවා සඳහා අයවිය යුතු ශේෂය රු. මිලියන 1,343.8 ක් වූ අතර එහි ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් 2017, 2019 සහ 2020 වර්ෂ සඳහා මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද බලශක්තිවල පිරිවැය වූ රු. මිලියන 1,336.9 ක් ඇතුළත්ව තිබුණි. කෙසේ වෙතත්, එම මුදල සඳහා ශේෂ තහවුරු කිරීම් විගණනයට ලැබී නොතිබුණි. තවද, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වගකීම හඳුනාගෙන නොතිබුණි. | 2021 වර්ෂය සඳහා ලැබිය යුතු මුදල දැනටමත් 2021 4 වන කාර්තුව සඳහා UNT ගාස්තු ගැලපීම සමඟ නිරවුල් කර ඇත. පෙර වසරවල ශේෂයන් පියවීම සම්බන්ධයෙන් සාකච්ඡා සිදු වෙමින් පවතී. | i. මණ්ඩලයෙන් ශේෂය අයකර ගැනීමට,<br>ii. විගණනය සඳහා ශේෂ තහවුරු කිරීම් ලබා දීමට,<br>කටයුතු කළ යුතුය. |
| iv. මණ්ඩලයේ ප්‍රාථමික උපපොලවල් ඉදිකිරීමට භාවිතා කරන ලද ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීමට සමාගම විසින් රු. මිලියන 206.9 ක් වියදම් කර තිබුණු අතර එම මුදල මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස සටහන් කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ ඉඩම්වල ප්‍රාථමික උපපොළවල් පිහිටුවීම සහ ඉහත සඳහන් ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීම සඳහා මණ්ඩලය විසින් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් සමාගම සහ මණ්ඩලය අතර විධිමත් ගිවිසුමක් නොතිබුණි. | සටහන් කර ගෙන ඇත. එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අතර ඔවුන්ගේ උපදෙස් පරිදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මණ්ඩලය සමග විධිමත් ගිවිසුමකට එළැඹීමට කටයුතු කළ යුතුය. |
| v. 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.9 වන වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත ක්‍රියාවලියක් සිදු කිරීමෙන් පසුව පාඩු කපා හැරිය හැකි අතර කපා හැරීම් පිළිබඳ විගණන කමිටුවේ නිර්දේශ ඇතුළුව නියමිත ක්‍රියාවලියක් අනුගමනය කරන බවට සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාගම මේ සම්බන්ධයෙන් එම | විගණකගේ නිරීක්ෂණ සමඟ එකඟ වේ. මෙම කපා හැරීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය ඇතිව පමණක් සිදු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යැවීමට පෙර කපා හැරීම සඳහා විගණන කමිටුවේ අනුමැතිය ගනු ලැබේ. | **චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.** |

| | | |
|---|---|---|
| ක්‍රියාවලිය අනුගමනය කර නොතිබූ අතර වීදි ලාම්පු සඳහා මහ නගර සභා සහ පළාත් සභාවලින් අයවිය යුතු රු. මිලියන 387.8 ක් වූ ණයගැති ශේෂය 2021 නොවැම්බර් 30 දින ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව සමාලෝචිත වර්ෂය තුළ කපා හැර තිබුණි. | | |
| vi. වසරේ අවසාන මාසය තුළ තොග නොවන පාරිභෝගිකයින්ගෙන් උපයාගත් ආදායම ඊළඟ වසරේ තොග නොවන පාරිභෝගිකයන්ගෙන් ලැබෙන ආදායම ලෙස හඳුනා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, 2020 දෙසැම්බර් මාසයේදී තොග නොවන පාරිභෝගිකයින්ගෙන් ලැබුණු ආදායම 2021 ජනවාරි මාසයේ ආදායම ලෙස හඳුනාගෙන තිබූ අතර, අනෙකුත් වසර සඳහා එම පරිචය අඛණ්ඩව යෙදාගෙන තිබුණි. එම නිසා, තොග නොවන පාරිභෝගිකයින්ගෙන් ලැබෙන ආදායමේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය නිසි ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. | සිල්ලර (තොග නොවන) බිල්පත් සෑම මසකම 1 වන දින සිට 25 වන දින දක්වා බෙදා හරියි. දෙසැම්බර් සහ ජනවාරි පරිභෝජනය දෙසැම්බර් බිල්පත් චක්‍රය සමඟ මිශ්‍ර වූ අතර මාස දෙකක් සඳහා ඒවා වෙන්කිරීමට අපහසු විය. එබැවින්, මෙම ආදායම් සෑම විටම ඊළඟ මාසය සමඟ කියවනු ලැබේ. | SLFRS-15, ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් පැන නගින ආදායම අනුව, ආදායම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඇ )    සී/ස ශ්‍රී ලංකා බලශක්ති (පුද්.) සමාගම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (i) 2018 ජනවාරි 01 දින සිට සමාගමේ මීටර් ආවරණ කර්මාන්ත ශාලාවේ ගොඩනැගිල්ල ක්ෂය කර නොතිබූ අතර, මීටර ආවරණ කර්මාන්ත ශාලාවට අදාළ ක්ෂයවීම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ අනාවරණය කර නොතිබුණි. | සී/ස ශ්‍රී ලංකා බලශක්ති (පුද්.) සමාගමෙහි මීටර් ආවරණ කර්මාන්ත ශාලාව, කර්මාන්තශාලා ගොඩනැගිල්ල සහ ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රෝපකරණ ඇතුළු ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. මේ දෙක අතර, ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්රෝපකරණ සහ ඉතිරි උපකරණ භාවිතයට තිබූ ස්ථානයේ සිට ක්ෂය වී ඇත. කර්මාන්තශාලා ගොඩනැගිල්ල පමණක් ක්ෂය කළ යුතු අතර මෙය ගැලපීම් කර ඒ අනුව අවශ්‍ය හෙළිදරව් කිරීම් 2022 මූල්‍ය ප්‍රකාශනවල සිදු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය, LKAS 16, දේපල, පිරියත හා | සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ඉදිරි මූල්‍ය වර්ෂයේදී හෙළිදරව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග | ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල |

| | | |
|---|---|---|
| උපකරණ හි 79(බී) ඡේදයට අනුව, සමාගම තවමත් භාවිතා කරන සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත හා උපකරණවල දළ ධාරණ අගය හෙළිදරව් කළ හැකිය. කෙසේ වෙතත්, භාවිතා කරන ලද රු. මිලියන 19 ක සම්පූර්ණ ක්ෂය වූ දේපල, පිරියත හා උපකරණවල මුළු පිරිවැය සමාගම විසින් අනාවරණය කර නොතිබුණි. තවද, සක්‍රීය භාවිතයෙන් විශ්‍රාම ගත් සහ විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය නොකළ දේපල, පිරියත හා උපකරණවල පිරිවැය SLFRS 5 ට අනුකූලව අනාවරණය කර නොතිබුණි. | ගනු ඇත. | විය යුතුය. |
| (iii) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ආදායම් බදු ප්‍රතිපාදනය රු. මිලියන 40.4 ක් වූ අතර, 2021 වර්ෂය සඳහා ආදායම් බදු ප්‍රතිපාදනය රු. මිලියන 9.7 ක් විය. කෙසේ වෙතත්, සමාගම විසින් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනවල විධිවිධානවලට අනුකූලව ආදායම් බදු ගණනය කිරීමක් පිළියෙල කර නොතිබුණි. එබැවින්, සමාගම විසින් සිදු කරන ලද ආදායම් බදු ප්‍රතිපාදනවල නිරවද්‍යතාවය සතුටුදායක ලෙස තහවුරු කර ගත නොහැකි විය. | සමාගම ආරම්භයේ සිට අවසන් ආදායම් බදු ගණනය කිරීම සිදු කරන තෙක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ අරමුණින් බදුවලට පෙර ලාභයෙන් සියයට 24 ක ආදායම් බදු ප්‍රතිපාදන සිදු කර ඇත. දැනට එය අවසන් කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතී. | දේශීය ආදායම් පනතට අනුකූල විය යුතුය. |
| (iv) තොග පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 02) 37 වැනි ඡේදයට අනුව, මූල්‍ය ප්‍රකාශනවල විවිධ වර්ගීකරණයන් යටතේ පවතින තොගවල ධාරණ අගයන් පිළිබඳ තොරතුරු සමාගම විසින් අනාවරණය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 06 යටතේ නිමි භාණ්ඩ, කෙරීගෙන යන වැඩ සහ අමුද්‍රව්‍ය වෙන වෙනම වර්ග කරමින් LKAS 02 ට අනුව තොග වර්ගීකරණය කර ඇත. | තොග නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (v) රු. මිලියන 40.4 ක් වූ ආදායම් බදු ප්‍රතිපාදන, 2021 වසරේ විකුණුම් මත රු, මිලියන 27.7 ක් වූ නිමවුම් | වැට් සහ එන්.බී.ටී ලිපිගොනු දැනටමත් ඉදිරිපත් කර ඇත. | විගණනයට අවශ්‍ය ලියකියවිලි නියමිත වේලාවට සැපයිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| වැට් බදු, රු. 595,036 ක් වූ ගෙවිය යුතු එන්.බී.ටී, රු. 67,100 ක් වූ මුද්දර ගාස්තු, රු. 136,795 ක් වූ ගෙවිය යුතු උපයන විට ගෙවන බදු සහ රු. 28,999 ක් වූ විලම්බිත බදු වත්කම්වලට අදාළ ප්‍රමාණවත් සහ සුදුසු තොරතුරු විගණනයට ලබා දී නොතිබුණි. තවදුරටත් ඊ.ටී.එෆ්, එන්.බී.ටී, උපයන විට ගෙවන බදු සහ වැට් බදු වාර්තා, ආදායම් බදු වාර්තා, ලැබී ඇති කිසියම් බදු තක්සේරු කිරීම් සහ අදාළ උපලේඛණ විගණනයට ලබා දී නොතිබුණි. | | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | | නිර්දේශය |
|---|---|---|---|
| | අංශය | පිළිතුර | |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 44,079 ක් වූ වෙළඳ ණයගැති ශේෂය අතුරින්, සාමාන්‍ය සහ තොග සැපයුම්වලට අදාළව රු. මිලියන 6,839 ක් වූ ණය ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර ඉන් රු. මිලියන 2,928 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි. | බෙදාහැරීමේ අංශය -01 රු. මිලියන 2318.21<br>බෙදාහැරීමේ අංශය -02 රු. මිලියන 3474.91<br>බෙදාහැරීමේ අංශය -03 රු. මිලියන 572.95<br>බෙදාහැරීමේ අංශය -04 රු. මිලියන 473.41<br>මූලස්ථානය රු. මිලියන 10 | 2022 වර්ෂයේ දී 2021 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂවලින් රු. මිලියන 4,920 ක මුදලක් අංශ විසින් අයකර ගෙන ඇති අතර සමහර ශේෂයන් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව, 2022 වර්ෂයේදී රු. මිලියන 8.96 ක මුදලක් කපා හැර තිබුණි.<br>සමහර අංශ මගින් අයකර ගත හැකි ශේෂයන් අයකර ගැනීම සඳහා කමිටු පිහිටුවා ඇති අතර මණ්ඩලයට අයවිය යුතු මුදල් කඩිනමින් ගෙවීමට පාරිභෝගිකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ නිලධාරීන් ගනුදෙනුකරුවන් සමග සාකච්ඡා කරමින් සිටී. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසමීකරණ යන්ත්‍ර | ලැබිය යුතු බොහෝමයක් රජයේ රෝහල්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලින් සමන්විත වේ. | | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රජයේ ආයතනයවලින් ලැබිය යුතු මුදල් යටතේ පෙන්වා ඇති රු. මිලියන 83.68 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගත නොහැකිව පැවතුණි. | ලිපි යැවීමෙන් සහ වෙනත් පියවරයන් භාවිතා කිරීමෙන් අයකර ගැනීමට පසු විපරම් කටයුතු කර ඇතත් එම ලැබිය යුතු මුදල් අයකර ගැනීමේ හැකියාව සැක සහිතය. එම අයකරගත නොහැකි ශේෂයන් කපා හැරීමට පියවර ගෙන ඇත. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නොර්දන් පවර් කම්පැනි පයිවට් ලිමිටඩ් වෙත ගෙවිය යුතු රු. බිලියන 2.9 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල සම්ප්‍රේෂණ අංශයේ වෙළඳ ණය හිමියන් යටතේ දක්වා තිබුණු අතර එම මුදල වසර තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ පියවීමෙන් තොරව පැවතුණි. | මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු තහනම් නියෝගයක් හේතුවෙන් නොර්දන් පවර් බලාගාරය 2015-01-27 සිට වසා දමා ඇත. කෙසේ වෙතත්, සමාගම මෙය Force Majeure තත්වයක් ලෙස ප්‍රකාශ කරමින් ධාරිතාව ගාස්තු සඳහා මාසික ඉන්වොයිසි නිකුත් කර ඇත. අධිකරණ තීන්දුව ලබා දීමට නියමිතව තිබූ බැවින් මණ්ඩලය මෙම ඉන්වොයිසි වටිනාකම් ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර ඇත. පරිසර නීතිය උල්ලංඝණය කරමින් බලාගාරය ක්‍රියාත්මක කර ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර ඇති බැවින් මෙම ඉන්වොයිසි පියවීමට මණ්ඩලයට වගකීමක් නැත. මෙම මුදල් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ඇත. | එම මුදල කපා හැරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිය. | නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයි.පී.පී) සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 6.02 ක් වූ ගිගාවෝට් 261.32 ක බලශක්තිය මිලදී ගෙන තිබුණි. | 2021 දී විශ්‍රාමලත් අයි.පී.පී බලාගාර 3 වන්නේ ඒස් පවර් ඇඹිලිපිටිය, ඒස් පවර් ජෙනරේෂන් මාතර සහ ඒසියා පවර්.<br>සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට විශ්‍රාමික අයි.පී.පී බලාගාරවලින් විදුලි බලය මිලදී ගැනීමට 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 7(1) හෝ 43(1) වගන්තිවලින් කිසිදු නීතිමය බාධාවක් නොමැත. මෙම විශ්‍රාමික අයි.පී.පී බලාගාර තුනේ කල් ඉකුත් වූ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීම සඳහා මණ්ඩලය මහජන උපයෝගීතා කොමිසම වෙතින් අනුමැතිය ඉල්ලා තිබූ අතර අනුමැතිය සඳහා ඔවුන් වෙත දීර්ඝ කරන ලද බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් ඉදිරිපත් කර ඇත.<br>ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය යටතේ කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ජනන ධාරිතාවක් ඇති බවට සහතික වීමේ මණ්ඩලයේ වගකීමට (සම්ප්‍රේෂණ බලපත්‍රයක් දරන්නෙකු වශයෙන්) අනුකූල වීමට | පනතේ එම විධිවිධානවල අවශ්‍යතාවලට අනුකූල විය යුතු අතර මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් විදුලිය මිලදී ගැනීම් සඳහා අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මණ්ඩලයට බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීමට සිදු විය. කිසියම් විදුලි කප්පාදුවක් පනවනු ලැබුවහොත්, කර්මාන්ත/හෝටල් සහ වාණිජ ගොඩනැගිලි සඳහා බලශක්තිය නොසැපයීම හේතුවෙන් රටේ ආර්ථිකයට සිදුවන බලපෑම පිළිබඳව මණ්ඩලය තවදුරටත් සලකා බලා ඇත. මණ්ඩලය කැබිනට් අනුමැතිය ඇතිව එය සිදු කර ඇත. | |
| (ආ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 46 වැනි වගන්තිය, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 11 (අ) හා (ආ) වගන්තිය. | 1989 සිට සෑම වර්ෂයක් අවසානයේ දී දළ ස්ථාවර වත්කම්වල මුළු වටිනාකමෙන් සියයට 0.1 ක දායකත්වයක් රක්ෂණ එස්ක්‍රෝ අරමුදලට මාරු කළ යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු. මිලියන 10,657 ක් පමණක් ආයෝජනය කර තිබුණි. විගණනයේදී කරන ලද ගණනය කිරීම්වලට අනුව, 2021 වර්ෂය තුළදී තවත් රු. මිලියන 852.87 ක් ආයෝජනය කළ යුතු බව අනාවරණය විය. | මණ්ඩලය වසර ගණනාවක සිට අහිතකර මුදල් ප්‍රවාහ තත්ත්වයන් අත්විඳින බැවින් රක්ෂණ ආයෝජන එස්ක්‍රෝ අරමුදලේ ආයෝජනය නොකිරීම මෙම වෙනස ඇති වීමට ප්‍රධාන වශයෙන්ම හේතුවී ඇත. ඉන්ධන සහ ගල් අඟුරු මිල ඉහළ යාම හේතුවෙන් ජනන පිරිවැය ඉහළ යද්දී පසුගිය වසර 8 තුළ ගාස්තු සංශෝධනයක් සිදු කර නොමැත. කෙසේවෙතත්, ලංවිම ද්‍රවශීලතා තත්ත්වය සහ මුදල් ප්‍රවාහය වැඩිදියුණු වූ පසු දළ ස්ථාවර වත්කම්වලින් සියයට 0.1 ට සමාන මුදලක් රක්ෂණ සංචිත ආයෝජන ගිණුමේ ආයෝජනය කිරීමට කටයුතු කරනු ඇත. | පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2022 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.5 වගන්තිය. | රේඛීය අමාත්‍යාංශයට සහ මණ්ඩලයේ අර්ථසාධක අරමුදලට මුදා හරින ලද සේවකයින් 65 දෙනෙකුට වැටුප් සහ අනෙකුත් ගෙවීම් ලෙස සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු. මිලියන 105.22 ක් ගෙවා තිබුණි. | මණ්ඩලයට රේඛීය අමාත්‍යාංශය විසින් සිය සේවකයන් අමාත්‍යාංශය වෙත මුදාහරින ලෙස කරන ලද ඉල්ලීම් අත්හිටුවීමට හැකියාවක් නොමැති අතර මේ සම්බන්ධයෙන් දරන වියදම් මණ්ඩලයට පාලනය කළ නොහැක. කෙසේ වෙතත්, මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා විසින් විදුලිබල අමාත්‍යාංශයට ලිපියක් යවා ඇති අතර, අමාත්‍යාංශයට මුදාහරින ලද සේවකයින්ගේ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කරන ලෙස ඉල්ලා ඇත. | මෙහෙයුම් අත්පොතේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ඈ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 1994 ජූනි 14 දිනැති | 2020 වර්ෂයේදී ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් ලෙස රු.බිලියන 1.2 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. | 2022.07.14 දිනැති පී.ඊ.ඩී චක්‍රලේඛය 03/2022 (I) ප්‍රකාරව, 2022 වසර සඳහා ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් අත්හිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| පී.ඊ.ඩී 95 චක්‍රලේඛය සහ 2020 සැප්තැම්බර් 25 දින අමාත්‍යාංශයේ විගණන කමිටුවේදී ගත් තීරණය. | | | |
| (ඉ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනතේ 47 වන වගන්තිය. | ඉපැයීම් ගණනය කිරීමේදී රදවා ගැනීමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනාව සහ වෘත්තීය දීමනාව /අර්ධ වෘත්තීය දීමනාව යන දිමනා අතුරින් ඉහළම දීමනාව මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන තිබුණි. එම ඉපැයීම් අනුව සේවක අර්ථසාධක ගෙවීම් කර තිබුණි. | 1958 අංක 15 දරන අර්ථසාධක අරමුදල් පනතේ 47 වැනි වගන්තියේ (එෆ්) උපවගන්තියේ සේවක අර්ථසාධක අරමුදල සඳහා ගෙවිය යුතු මුදල ගණනය කිරීම සඳහා "නියම කළ හැකි වෙනත් ආකාරයේ වැටුප්" භාවිතා කළ හැකි බව සඳහන් වේ. මෙම වගන්තියට අනුකූලව, සේවක අර්ථසාධක අරමුදල සඳහා ඉපැයීම් ගණනය කිරීමේදී රදවා ගැනීමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනා ගෙවීම් හෝ වෘත්තීය දීමනාව / අර්ධ වෘත්තීය දීමනා අතුරින් ඉහළ දිමනාව සලකා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව මෙය නීතියට පටහැනි නොවේ. | අර්ථසාධක අරමුදල් පනතට අනුව සේවක අර්ථසාධක අරමුදලට අදාළ වැටුප සඳහා ජීවන වියදම් දීමනා පමණක් එකතු කිරීමට අවසර ඇත. එබැවින්, මෙම ක්‍රියාව නීතියට පටහැනි වන අතර එම විධිවිධානයට අනුකූල විය යුතුය. |
| (ඊ) 2007 ජනවාරි 10 දින සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සමඟ එළඹී විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තිය. | කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ සපයන විදුලිබලයට අදාළ වන නියම හා කොන්දේසි නොමැති නම්, කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ මණ්ඩලය විසින් සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමට සපයනු ලබන විදුලිබල ශක්තිය, විදුලිබල පිරිවැය යටතේ අය කර යුතු වේ. කෙසේවෙතත්, ධාරිතා ගාස්තුව සහ අනෙකුත් ගාස්තු නොසලකා සමාගමට මණ්ඩලය විසින් සපයනු ලබන විදුලිබල ශක්තියේ අනුපාතය ගණනය කිරීම සඳහා මණ්ඩලය | සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමේ කෙරවලපිටිය බලාගාරය 220 kV වෝල්ටීයතා මට්ටමින් මණ්ඩලයේ ජාලයට සම්බන්ධ කර ඇති අතර එම වෝල්ටීයතා මට්ටමින් විදුලි මිනුම් පද්ධතිය සවි කර ඇත. 2021-12-16 දිනැති අතිරේක සමාන්‍යාධිකාරීගේ (බෙදාහැරීමේ අංශ 2) ලිපිය මගින් සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සම්ප්‍රේෂණ පාරිභෝගිකයෙකු ලෙස සලකා බැලීමට පියවර ගන්නා ලෙස ඉල්ලා ඇත. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2022-01-24 දින නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (ඊ.එම්) ශාඛාවේ රැස්වීමක් පවත්වන ලද අතර එහිදී තීරණය කරන ලද්දේ,<br>අ) දැන් භාවිතාකරන හිලව් කිරීමේ ක්‍රමය අනුගමනය කිරීම සඳහා නිකුත් කර ඇති විධානයන් සෙවීම සහ;<br>ආ) හිලව් කිරීමේ ක්‍රමයෙන් මණ්ඩලය විසින් වෙස්ට් කෝස්ට් පවර් සමාගමෙන් අයකරන ලද මුදල සහ අදාළ මුළු කාලය සඳහා I3 ගාස්තුව සැසඳීම. | ගිවිසුමේ සඳහන් විධිවිධානයේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විසින් බලශක්ති ගාස්තුව පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. | 2014-11-12 දිනැති අතිරේක සමාන්‍යාධිකාරීගේ (ආයතනික උපායමාර්ග) ලිපිය මගින් විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තියට අනුව මණ්ඩලයෙන් පරිභෝජනය කරන විදුලිය හිලව් කිරීම සිදු කළ හැක්කේ සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමට ගෙවිය යුතු බලශක්ති ගාස්තුවෙන් පමණක් බව නිරීක්ෂණය විය. එම විධානයට අනුව 2014 ඔක්තෝබර් මාසයේ සිට සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම ලබා ගන්නා බලශක්තියේ වටිනාකම මණ්ඩලය විසින් හිලව් කර ගැනීම ආරම්භ කර ඇත.<br>සැසඳීමට අනුව, හිලව් කිරීමේ ක්‍රමයෙන් මණ්ඩලය විසින් වෙස්ට් කෝස්ට් වෙතින් අය කරන ලද මුදල අදාළ මුළු කාලය සඳහා I3 ගාස්තු ක්‍රමයේ මුදලට වඩා වැඩිය. එබැවින්, දැනට සම්ප්‍රේෂණ අංශය විසින් සිදු කරනු ලබන හිලව් කිරීමේ ක්‍රමය දිගටම කරගෙන යාමටත්, සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සම්ප්‍රේෂණ පාරිභෝගිකයෙකු ලෙස සැලකීමටත්, අනුමත සම්ප්‍රේෂණ පාරිභෝගික ගාස්තුවක් තිබේ නම් සම්ප්‍රේෂණ අංශය වෙත මාරු කිරීමටත් තීරණය කර ඇත. | |
| (උ) 2018 ඔක්තෝබර් 3 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය. | රජයේ ආයතන සතු පොරොත්තු ජනක යන්ත්‍ර උපයෝගී කර ගැනීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී ඇත. | විවිධ හේතූන් මත මෙම තීරණය මෙතෙක් ක්‍රියාත්මක වී නොමැත. | කැබිනට් තීරණයට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) 2021 නොවැම්බර් 21 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 5.1 වගන්තිය. | මණ්ඩලය දිගින් දිගටම පාඩු ලැබුවද කෙටුම්පත් සාමූහික ගිවිසුම් මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදී රු. බිලියන 2.7 ක් ප්‍රසාද දීමනාවක් ලෙස ගෙවා තිබුණි. | වෘත්තීය සමිතිවලින් 2021 වසර සඳහා ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධයෙන් මණ්ඩලයේ කළමනාකාරිත්වයට ලැබුණු විවිධ ඉල්ලීම් මත පදනම්ව, කළමනාකාරිත්වය 2021 දෙසැම්බර් 06 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ඉල්ලන ලදි. අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රසාද දීමනා ගෙවීමට තීරණය කළ අතර 2021 දෙසැම්බර් 17 වැනි දින මණ්ඩලයේ සමාන්‍යාධිකාරී වෙත දැනුම් දෙන ලදි. | මෙහෙයුම් අත්පොතේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

### 1.8 බඳු රෙගුලාසිවලට අනුකූල නොවීම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වැටුප් සංශෝධනය කරන අවස්ථාවකදී 2007 දෙසැම්බර් 13 වන දින අමාත්‍ය | 2020 නොවැම්බර් මාසයේ සිට, අමාත්‍ය මණ්ඩල තීරණයට සහ අත්තිකාරම් පුද්ගලික ආදායම් චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය | |

මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය සහ 2015 මැයි 20 වන දින එළඹී සාමූහික ගිවිසුම අනුව, උපයන විට ගෙවන (PAYE) බදු/ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) වගකීම මණ්ඩලයේ සේවකයින් වෙත මාරු කිරීමට තීරණය කර තිබුණි. කෙසේවෙතත්, 2010 සිට 2020 දක්වා කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණවලට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 2016/3 දරන චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර මණ්ඩලය විසින් සිය අරමුදලෙන් රු. බිලියන 4.98 ක PAYE/ APIT බදු ගෙවා තිබුණි.

බද්ද (APIT) මණ්ඩලයේ යුතුය. සේවකයින් විසින් ගෙවනු ලැබේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 6,016 ක අලාභයක් වූ අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ අලාභය රු. මිලියන 51,530 ක් විය. එම නිසා, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 45,514 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. ජල විදුලිය උත්පාදනය සියයට 45 කින් ඉහළ යාම හේතුවෙන් විදුලිය මිලදී ගැනීමේ පිරිවැය සහ ඉන්ධන පිරිවැය පිළිවෙළින් සියයට 22 කින් සහ සියයට 19 කින් අඩුවීම ප්‍රධාන හේතුවයි.

### 2.2 ප්‍රවණතා විශ්ලේෂණය

#### (අ) විදුලිබල උත්පාදනය

මණ්ඩලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ අඩු වියදමකින් රටට විදුලිය සැපයීම වුවද, විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම්වල ඇති අහිතකර කොන්දේසි, තාප විදුලිය උත්පාදනය සඳහා අධික පිරිවැයක් දැරීම සහ සුළඟින් හා වෙනත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ලැබෙන අඩු දායකත්වය හේතුවෙන් මණ්ඩලයට මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය.
තවද, මණ්ඩලයේ දිගුකාලීන උත්පාදන සැලැස්මට හා සම්ප්‍රේෂණ සැලැස්මට ඇතුළත් කර ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මණ්ඩලය විසින් හදිසි විදුලි මිලදී ගැනීම් සිදු කර තිබූ අතර එය මණ්ඩලයේ අවම පිරිවැය පරමාර්ථයට බලපා ඇත.

2021 දී විදුලිබල උත්පාදනය කිරීමේ තත්ත්වය පසු ගිය වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| මූලාශ්‍රය | 2021 | 2020 | වැඩිවීම/ (අඩුවීම) | |
|---|---|---|---|---|
| | ගි.වො.පැය | ගි.වො.පැය | ගි.වො.පැය | % |
| ---------------- | ----------- | ------------- | ----------- | ------------ |
| ජල විදුලිය | 7,208 | 4,958 | 2,250 | 45 |
| තාප | 2,631 | 4,179 | (1,548) | (37) |
| ගල් අඟුරු | 5,519 | 5,754 | (235) | (4) |
| සුළඟ | 645 | 332 | 313 | 94 |
| අනෙකුත් | | | | |

| | | | | |
|---|---|---|---|---|
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය | 163 | 100 | 63 | 63 |
| ග්‍රිඩ් සම්බන්ධිත සූර්ය | 156 | 118 | 38 | 32 |
| වහල මත සූර්ය | 389 | 269 | 120 | 45 |
| කුඩා දූපත් | 2.7 | 2.6 | 0.1 | 4 |
| | -------- | ------- | --------- | ------ |
| **එකතුව** | **16,713.7** | **15,712.6** | **1,001.1** | **6** |
| | ===== | ===== | ===== | === |

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ජල විදුලිය, සුළඟ, අනෙකුත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය, ග්‍රිඩ් සම්බන්ධිත සූර්ය සහ වහල මත සූර්ය පිළිවෙලින් සියයට 45 කින්, සියයට 94 කින්, සියයට 63 කින්, සියයට 32 කින් සහ සියයට 45 කින් වැඩි වී තිබුණු අතර රටේ කාලගුණ තත්ත්වය වාසිදායකවීම හේතුවෙන් තාප සහ ගල් අඟුරු බලශක්ති උත්පාදනය පිළිවෙලින් සියයට 37 කින් සහ සියයට 4 කින් අඩු වී ඇත.

(ආ) **සෘජු පිරිවැය (බෙදාහැරීම සහ සම්ප්‍රේෂණය හැර)**

2021 වර්ෂයේ කාණ්ඩය අනුව සෘජු පිරිවැය පිළිබඳ විශ්ලේෂණය පසු ගිය වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| **විස්තරය** | **2021** | **2020** | **වැඩිවීම/ (අඩුවීම) ප්‍රතිශතය** |
|---|---|---|---|
| | **රු . මිලියන** | **රු . මිලියන** | **%** |
| ඉන්ධන | 24,373 | 30,195 | (19.28) |
| ගල් අඟුරු | 47,311 | 42,805 | 10.52 |
| විදුලිබලය මිලදී ගැනීම | 85,690 | 110,213 | (22.25) |
| මෙහෙයුම් සහ නඩත්තුව | 64,172 | 61,793 | 3.8 |
| ක්ෂයවීම | 32,907 | 31,932 | 3 |
| | ----------- | ---------- | -------- |
| **මුළු සෘජු පිරිවැය** | **254,453** | **276,938** | **(8.12)** |
| | ====== | ====== | ==== |

ඉහත තොරතුරුවලට අනුව, අවම පිරිවැය බලශක්ති ප්‍රභවයන් හරහා (ජල, සුළං, වෙනත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති, ග්‍රිඩ් සම්බන්ධිත සූර්ය සහ වහල මත සූර්ය) බලශක්ති උත්පාදනය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස පෙර වසරට සාපේක්ෂව ඉන්ධන පිරිවැය සහ විදුලිය මිලදී ගැනීමේ පිරිවැය පිළිවෙලින් සියයට 19.28 කින් සහ සියයට 22.25 කින් අඩු වී ඇති බව අනාවරණය විය. කෙසේ වෙතත්, ගල් අඟුරු පිරිවැය සියයට 10.52 කින් වැඩි වී තිබුණද, ගල් අඟුරු මිල ඉහළ යාම හේතුවෙන් ගල් අඟුරු හරහා විදුලිය නිපදවීම පවා සියයට 4 කින් අඩු විය.

## 2.3 අනුපාත විශ්ලේෂණය

### 2.3.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට සමූහයේ කාරක ප්‍රාග්ධනය රු. මිලියන 76,634 ක ඍණ අගයක් ලෙස පිළිබිඹු වූ අතර පසුගිය වර්ෂයේ ඍණ ශේෂය රු. මිලියන 72,109 ක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 6 කින් අඩු වී තිබුණි.

### 2.3.2 ස්කන්ධයට ණය

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2021 දෙසැම්බර් 31 දිනට සමූහයේ ස්කන්ධ ශේෂය රු. මිලියන 10,517 කින් හෙවත් සියයට 3 කින් වැඩි වී තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දිනට සමූහය විසින් යොදවා ඇති මුළු ප්‍රාග්ධනයෙන් සියයට 47 ක් හෙවත් රු. මිලියන 427,653 ක් ණය ලබාගැනීම මඟින් මූල්‍යනය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ ස්කන්ධයට ණය අනුපාතය පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 123 සිට සියයට 125 දක්වා වැඩි වී තිබුණි.

### 2.3.3 ලාභදායීතාවය

සමාලෝචිත වර්ෂයේ ඒකකයක සාමාන්‍ය පිරිවැය රු. 18.63 ක් වූ අතර ඊට සාපේක්ෂව 2020 වර්ෂයේ එය රු. 21.67 ක් විය. ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.37 ක් විය. (පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.72 කි). ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ ඒකකයක දළ අලාභය රු. 2.26 ක් වූ අතර පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය දළ අලාභය වන රු. 4.95 ට සාපේක්ෂව එය සියයට 54.34 කින් අඩු වී ඇත. සමාලෝචිත වර්ෂය තුළදී විකුණන ලද විදුලිය සඳහා වන ගාස්තු කාණ්ඩය, ඒකකයක ( කි.වො.පැය ) සහභාගය සහ මුළු සහභාගය පසු ගිය වර්ෂය සමඟ සසඳා පහත වගුවේ දැක්වේ.

| | 2021 | | 2020 | |
|---|---|---|---|---|
| **කාණ්ඩය** | **ඒකකයක සහභාගය ( රු/කි.වො. පැයක )** | **මුළු සහභාගය රු.මිලියන** | **ඒකකයක සහභාගය ( රු/කි.වො.පැ යක )** | **මුළු සහභාගය රු.මිලියන** |
| ගෘහස්ථ | (3.72) | (19,485.36) | (6.81) | (34,662.90) |
| ආගමික | (11.46) | (928.26) | (14.45) | (1,184.90) |
| පොදු අරමුණු | 5.09 | 14,745.73 | 2.26 | 6,411.62 |
| හෝටල් | (0.86) | (189.20) | (3.57) | (689.01) |
| කාර්මික | (3.96) | (19,095.12) | (6.83) | (28,440.12) |
| රජය | (0.31) | (70.06) | (3.60) | (748.80) |
| ලේකො වෙත තොග සැපයුම වීදි | (4.59) | (7,495.47) | (5.64) | (9,052.20) |
| ආලෝකකරණය | (18.61) | (1,805.17) | (21.64) | (2,337.12) |
| **එකතුව** | **(2.26)** | **(34,383.64)** | **(4.95)** | **(70,720.65)** |

ඒ අනුව, පොදු අරමුණු යටතේ ගාස්තු කාණ්ඩය පමණක් සමාලෝචිත වර්ෂයේ සමස්ත සහභාගයට ධනාත්මක දායකත්වයක් කර ඇති අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 130 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ත සහභාගය සඳහා ඉහළම ඍණාත්මක දායකත්වය ලබා දී ඇත්තේ කාර්මික හා ගෘහස්ථ කාණ්ඩයේ ගාස්තු වන අතර ආගමික, හෝටල්, රජය, ලේකො වෙත විකුණුම් සහ වීදි ආලෝකකරණය යන ගාස්තු ද අහිතකර දායකත්වයක් පෙන්නුම් කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018-2037 දීර්ඝකාලීන විදුලි ජනන සැලැස්මට අනුව, සීතාවගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (පී.එම්.යූ) 2016 සැප්තැම්බර් මාසයේදී ස්ථාපිත කළ අතර ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක සැලසුම් කිරීම සහ කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන සකස් කිරීම වැනි කටයුතු සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය මඟින් 2020 වර්ෂය අවසානයේදී රු. මිලියන 301.19 ක මුළු වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. තවද, 2021 පෙබරවාරි 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, මෙම ව්‍යාපෘතිය සී/ස ශ්‍රී ලංකා බලශක්ති (පුද්) සමාගම හරහා සංවර්ධනය කිරීමට සහ මෙම කොන්ත්‍රාත්තුව "තනි ප්‍රභව ප්‍රසම්පාදනයක්" ලෙස එම සමාගමට ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව, ඉහත සඳහන් කාර්යයන් සඳහා දරන ලද මෙම වියදම වෙනත් ආයෝජකයෙකුට භාවිතා කළ නොහැකි බැවින් ව්‍යාපෘතිය මගින් දරන ලද රු. මිලියන 301.19 ක් මණ්ඩලයේ වියදමක් ලෙස හඳුනාගැනීමට සිදුවීමේ අවදානමක් ඇති බව නිරීක්ෂණය විය. | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඔවුන්ගේ නිරීක්ෂණ සඳහා විගණන කමිටුව වෙත යොමු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙතෙක් සිදු කර ඇති කාර්යය ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් | දිගුකාලීන, අඩු වියදම් බලාගාර අපේක්ෂා කළ පරිදි නියමිත වේලාවට සංවර්ධනය නොකළ විට, (මණ්ඩලයේ පාලනයෙන් බැහැර බොහෝ හේතු නිසා) හිඟය වළක්වා ගැනීමට සහ විදුලිබල පනතේ 24(1)(ඇ) වගන්තිය යටතේ කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් | දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලයට හැකි විය යුතුය. කෙසේවෙතත්, දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම අනුව විදුලි බලාගාර ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිඵලයක් ලෙස තාප විදුලිය කෙටි කාලීන පදනමින් අධික පිරිවැයක් යටතේ මිලදී ගැනීමට මණ්ඩලයට සිදු වී තිබුණි. | ජනන ධාරිතාවක් ඇති බව සහතික කිරීමේ මණ්ඩලයේ (සම්ප්‍රේෂණ බලපත්‍රය දරන්නා ලෙස) වගකීමට අනුකූල වීම සඳහා කෙටි කාලීන අතිරේක ධාරිතාවක් ලබා ගැනීමට මණ්ඩලයට බලකෙරේ.<br>මේ අනුව, එම ප්‍රසම්පාදනය 24(1)(ඇ) වගන්තියට අනුකූල වීමට සිදු කර ඇති අතර එම නිසා එය උල්ලංඝනය කිරීමක් නොවේ.<br>තවද, මණ්ඩලය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැසුම් සකස් කළද, දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මෙහි හඳුනාගෙන ඇති එවැනි බලාගාර සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලයට තනිව බලයක් නොමැත. මණ්ඩලය අනෙකුත් ආයතන මත දැඩි ලෙස රඳා පවතින අතර මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද "2016 අංක 02 දරන විදුලි (ප්‍රසම්පාදන) රීති"සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වැනි අනෙකුත් ආයතනවල රීති සහ මාර්ගෝපදේශ මගින් පාලනය වේ. මෙම ක්‍රියාවලීන්ගෙන් සමහරක් අති ව්‍යාප්ති වේ. | |
| (ආ) 2017 මැයි 16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී චයිනා මැෂිනරි ඉන්ජිනියරින් කොපරේෂන්හි (සී.එම්.ඊ.සී) ඉංජිනේරුවන්ගේ තාක්ෂණික දැනුම මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත පැවරීමේ ශක්‍ය වැඩපිළිවෙළක් තිබිය යුතු බව අවධාරණය කරන ලදි. කෙසේ වෙතත්, එම තීරණය සැලකිල්ලට නොගෙන 2017 නොවැම්බර් 23 සහ 2020 පෙබරවාරි 25 යන දිනවලදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව ලක්විජය බලාගාරයේ මෙහෙයුම් සහ නඩත්තු කිරීම් සඳහා වන පිළිවෙලින් දෙවන සහ තෙවන තාක්ෂණික සහයෝගීතා ගිවිසුම්වලට මණ්ඩලය විසින් අත්සන් කර තිබුණි. එකී ගිවිසුම් දෙක සඳහා මුළු ඉන්වොයිසි වටිනාකම (2017 ඔක්තෝබර් 01 සිට 2021 සැප්තැම්බර් 30 දක්වා) එ.ජ.ඩො 13,766,367 ක් විය. තවද, 2022 ජනවාරි 01 සිට වසරක කාලයක් සඳහා බලාගාරයේ මෙහෙයුම් සහ | මුලදී 2017 දී 170 ක් පමණ වූ සී.එම්.ඊ.සී කාර්ය මණ්ඩලය වැඩ කරමින් සිටියහ. කාලයත් සමඟ ඔවුන්ගේ දැනුම මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත පැවරීමෙන් එය 15 දක්වා පමණක් අඩු විය.<br>වත්මන් තත්ත්වය පහත පරිදි වේ.<br>ගරු විදුලිබල අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය (82/2921/ඊ) සැලකිල්ලට ගනිමින් මෙහෙයුම් සහ නඩත්තු උපදේශන සේවාව සැපයීම සඳහා සී.එම්.ඊ.සී වෙත ගෙවිය යුතු සියලුම හිඟ ගෙවීම් ගෙවීමට 2021 දෙසැම්බර් 29 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. අදාළ තීරණයේ යොමු අංකය PE/TEN/SCAPC/SJ/2021/18 වේ.<br>බිඳවැටීම් සංඛ්‍යාව බලාගාර කාර්ය සාධනය පිළිබිඹු නොකරයි. අභ්‍යන්තර හා බාහිර ගැටළු හේතුවෙන් බලාගාර බිඳවැටීම් සිදු වේ. බාහිර ගැටළු ලක්විජය බලාගාරයට පාලනය කළ නොහැක. බලාගාරවල ක්‍රියාකාරීත්වය තක්සේරු කිරීම සඳහා බලාගාර උපයෝජ්‍යතා සාධකය (Plant availability factor) සහ බලාගාර සාධකය (plant factor) සුදුසු දර්ශක වේ. | ගිවිසුමකට එළඹීමට පෙර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. |

නඩත්තු කිරීම් සඳහා වන තාක්ෂණික උපදේශන සේවාව ලබා ගැනීම සඳහා සි/ස සී.එම්.ඊ.සී ලංකා (පුද්.) සමාගම සමඟ 2021 දෙසැම්බර් 27 වැනි දින රු. මිලියන 435.64 ක (වැට් බද්ද ඇතුළුව) පිරිවැයක් සහිතව තවත් ගිවිසුමකට එළඹී තිබුණි. බලාගාරයේ මෙහෙයුම් සහ නඩත්තු කිරීම් සඳහා එවැනි ගිවිසුම්වලට එළඹීමෙන් පසුවද, 2021 වර්ෂය තුළදී පමණක් දින 105 ක පාඩුවක් සහ මෙ.වො. පැය 758,587 ක බලශක්ති අහිමිවීමක් සමඟ බිඳවැටීම් 16 ක් සිදුවී තිබුණි. එම බිඳවැටීම් රටේ විදුලිබල සැපයුමට සැලකිය යුතු අහිතකර බලපෑම් ඇති කර තිබුණි.

(ඇ) අමතර ඉඩ අවශ්‍යතාවය, විෂය පථයේ වෙනස්වීම් සහ මිල උද්ධමනය නිසා 2011 සිට 2021 දක්වා ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන් යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1000 සිට රු. මිලියන 6,161.87 ක් (උපදේශනය සහ පෙර කොන්ත්‍රාත්කරු සඳහා කරන ලද ගෙවීම් ඇතුළුව) දක්වා වැඩි වී තිබුණි. තවද, 2023 වර්ෂයේදී නව ගොඩනැගිල්ල නිම කිරීමට සැලසුම් කර තිබියදීත් හිමිකාරිත්වය තහවුරු කර නොතිබූ දැනට පවතින ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2017 සිට 2020 දක්වා කාලය තුළ මණ්ඩලය විසින් රු. මිලියන 284.41 ක් වැය කර තිබුණි.

යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත පිරිවැය ඉහළ යාමට හේතු පහත පරිදි හඳුනාගෙන ඇත.

i. ගොඩනැගිල්ල තුළ ඇති ඇට්‍රියම් වෙල් වසා දැමීමෙන් කාර්යාල සඳහා උපරිම අවකාශයක් ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය වැඩි කර ඇත. එබැවින් වාස්තු විද්‍යාත්මක බිම් ප්‍රමාණය වර්ග මීටර් 27,750 සිට වර්ග මීටර් 33,818 දක්වා වැඩි කරන ලද අතර එම නිසා මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 6,068 (වර්ග අඩි 65,290 ක්) කින් වැඩි කර ඇත. ඒ අනුව, අතිරේක වැඩ හේතුවෙන් පිරිවැය වැඩි වේ.
ii. 2018 දෙසැම්බර් සිට 2021 මාර්තු දක්වා කාල සීමාව සඳහා ද්‍රව්‍ය මිල ගණන් සැලකිය යුතු ලෙස වැඩි වීම.
iii. සියලුම කාර්යාල සඳහා අභ්‍යන්තර බෙදුම් (partition) හඳුන්වා දීම.
iv. ගොඩනැගිලි පිරිසිදු කිරීමේ පද්ධතිය, ප්‍රවේශ පාලන පද්ධතිය, CCTV කැමරා පද්ධතිය, ගෑස් සැපයීම, කැලි කසළ පවිත්‍රාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම වැනි පෙර සැලසුමට ඇතුළත් නොවූ අත්‍යවශ්‍ය ගොඩනැගිලි සේවාවන් හඳුන්වා දීම.

දැනට පවතින ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල දශක පහකට පමණ පෙර ඉදිකරන ලද අතර තවමත් ක්‍රියාත්මක වේ. සී.ඊ.සී.බී උපදේශකගේ නිර්දේශය පරිදි තවත් වසර විස්සක් ඔරොත්තු

අනවශ්‍ය වියදම් වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය ව්‍යාපෘති කාල සීමාව තුළ අවසන් කර ඇති බවට සහතික වීම.

| | | |
|---|---|---|
| | දීම සඳහා ගොඩනැගිල්ලේ වයසට යාමත් සමඟ අලුත්වැඩියා හා නඩත්තු කටයුතු කිහිපයක් සිදු කර ඇත. එබැවින්, දැනට පවතින ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය මගින් සිදු කර ඇත.<br>තවද, සිවිල් ගුවන් සේවා සීමා කිරීම් හේතුවෙන් නාරාහේන්පිට යෝජිත නව මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ මහල් ගණන මහල් එකොළහකට සීමා වී ඇති අතර කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල කුලියට ගත් කාර්යාල සඳහා වත්මන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල භාවිතා කිරීමට මණ්ඩලය අපේක්ෂා කරයි. | |
| (ඇ) 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක, මෙගාවොට් 657 ක, මෙගාවොට් 430 ක සහ මෙගාවොට් 445 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද මෙගාවොට් 2,032 ක නව ධාරිතාවයෙන් එකතුව මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා, නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු ලෙස අඩු වී තිබුණු අතර සැලසුමේ අරමුණ වූ අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීම ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුලදී රු. බිලියන 6.54 ක් වටිනා ගිගාවොට් පැය 267.17 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණි. | මණ්ඩලය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැසුම් සකස් කළද, දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැසුමෙහි හඳුනාගෙන ඇති එවැනි බලාගාර සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලයට තනිව බලයක් නොමැත. මණ්ඩලය අනෙකුත් ආයතන මත දැඩි ලෙස රඳා පවතින අතර මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද "2016 අංක 02 දරන විදුලි (ප්‍රසම්පාදන) රීති"සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වැනි අනෙකුත් ආයතනවල රීති සහ මාර්ගෝපදේශ මගින් පාලනය වේ. මෙම ක්‍රියාවලීන්ගෙන් සමහරක් අති ව්‍යාප්ති වේ. | අවම පිරිවැය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම. |

(ඉ) වයිනා මැෂිනරි ඉන්ජිනියරින් කොපරේෂන් විසින් ඉදිරිපත් කරන ලද පුහුණුකිරීමේ ලේඛනයට අනුව, උපකරණවල ක්‍රියාකාරිත්වය නඩත්තු කිරීම, ප්‍රකෘතිමත් කිරීම හෝ වැඩිදියුණු කිරීමට ඒකකය සඳහා පුළුල් විසුරුවීම් පරීක්ෂා කිරීම (comprehensive disassembling inspection) සහ අලුත්වැඩියා කිරීම සඳහා වන A මට්ටමේ නඩත්තු කාල පරාසය වසර 4 සිට 6 දක්වා විය යුතුය. කෙසේ වෙතත්, ලක්විජය බලාගාරයේ ඒකක 02 සහ 03 සඳහා A මට්ටමේ නඩත්තුව එම ඒකක ක්‍රියාත්මක කර වසර 7ක් ගතවී ඇතත් එය සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. මෙගා වෝට් පැය 663,510 ක බලශක්ති අහිමිවීමක් සමඟ සමාලෝචිත වර්ෂය තුළදී ලක්විජය බලාගාරයේ ඒකක 02 සහ 03 සම්බන්ධ බිඳවැටීම් 13 ක් සිදුවී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

2 වන ඒකකයේ A මට්ටමේ නඩත්තුව මුලදී 2020 දී සැලසුම් කර තිබුණි. මෙම සේවාව ප්‍රසම්පාදනය සඳහා 2020 පෙබරවාරි මාසයේදී ස්ථාවර අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවක් (SCAPC) පත් කරන ලෙස මණ්ඩලය ඉල්ලා තිබුණි. 2020 දී SCAPC සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් (TEC) පත් කිරීම මගින් විශේෂඥ සේවය ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. සී.එම්.ඊ.සී වෙතින් ලංසුවක් කැඳවන ලද අතර, අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2021 ජුලි 1 වැනි දින ලැබී තිබුණි. 2021 ජුලි 16 වැනි දින සී.එම්.ඊ.සී වෙත මිනිස් සේවා කොන්ත්‍රාතුව ප්‍රදානය කර ඇත.

- 2020 වසරේ ලෝක ව්‍යාප්ත කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට නොහැකි විය. රටවල් දෙකෙහිම අගුලු දැමීමේ තත්ත්වය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා බලපෑ ඇත.
- නඩත්තුව 2021 සැප්තැම්බර් දක්වා නැවත සැලසුම් කරන ලද අතර ලංවිම සහ සී.එම්.ඊ.සී අතර ගිවිසුම් අත්සන් කර ඇත. නමුත් සී.එම්.ඊ.සී විසින් කරන ලද ඉල්ලීම අනුව චීන විශේෂඥයින් සක්‍රීය සේවයට කැඳවීමට නොහැකි විය. දෙරටේම පනවා ඇති කොවිඩ්-19 සීමා කිරීම් නිසා එම කාර්යය 2022 දක්වා කල් දමා ඇති අතර 2022 ජුනි දක්වා නඩත්තුව කල් දැමීමට මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.
- 2 වන ඒකකය 2022 ජුනි 18 වැනි දින උදැසන A මට්ටමේ නඩත්තුවක් සඳහා නවතා තබා ඇත.

විගණන ප්‍රකාශයේ සඳහන් බිඳවැටීම් සංඛ්‍යාව 14 කි. අභ්‍යන්තර හා බාහිර දෝෂයන් නිසා සිදුවන බිඳවැටීම් සලකා බැලීමෙන් බිඳවැටීම් ගණන ගණනය කෙරේ. අභ්‍යන්තර දෝෂය බලාගාරය තුළ ඇති යන්ත්‍රෝපකරණ සහ උපකරණවල සිදුවන දෝෂයයි. බාහිර දෝෂය ජාතික විදුලිබල පද්ධතිය හරහා ඇති වෙන ගැටළු හේතුවෙන් බලාගාරයෙන් පිටත සිදුවන දෝෂයයි.
ඉතා කෙටි කාලයක් තුළ පවතින අභ්‍යන්තර දෝෂ හේතුවෙන් සමහර බිඳවැටීම් සිදුවී ඇති අතර එය නිවැරදි කර පැය කිහිපයක් ඇතුළත බලාගාරය නැවත ආරම්භ කළ හැකිය. තවද මෙම ආකාරයේ බිඳවැටීම සමස්ත බලාගාරයේ

විගණක විසින් ගණනය කරන ලද බිඳවැටීම අභ්‍යන්තර බිඳවැටීම් මත පදනම් වන අතර ඊට බලකළ ඇනහිටීම් හේතුවී තිබුණි. එසේම එය බාහිර දෝෂයන් සහ සැලසුම්ගත ඇනහිටීම්වලින් තොරය. එබැවින්, නඩත්තු කිරීම, ප්‍රතිසාධනය කිරීම හෝ උපකරණවල කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා කාලසටහනට අනුව නඩත්තු කිරීම කාලීනව සිදු කළ යුතුය.

| | | |
|---|---|---|
| | ක්‍රියාකාරිත්වයට බලපෑමක් නොමැත. බලාගාරය ආරම්භ කළ දින සිට ඒකක 02 සහ ඒකක 03 මගින් ජනනය කරන ලද මුළු ශුද්ධ බලශක්තිය පිළිවෙලින් ගිගාවොට් 15,482.01 ක් සහ ගිගාවොට් 14,087.50 වේ. | |
| (ඊ) ලයිටින් ශ්‍රී ලංකා හම්බන්තොට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 15 ක් ගතවී ඇතත් නොවිසඳුණු විරෝධතා හේතුවෙන් තංගල්ල සිට නොනගම දක්වා ගැන්ට්‍රි මාර්ගයේ (කුළුණ 13 සිට 36 දක්වා) ඉතිරි වැඩ අවසන් කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | විරෝධතා කිහිපයක් ලැබී ඇත. පී.එච්.එම් ශාඛාව විසින් මහජන උපයෝගිතා කොමිෂන් සභා මාර්ගෝපදේශයන්ට අනුකූලව නිසියාකාරව මංවර එළිපෙහෙළි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මේ තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෑතකදී තංගල්ල ප්‍රාදේශීය ලේකම් සහ අදාළ ග්‍රාම නිළධාරීන් හමු වී ඇත. | ගැටලුව විසඳීමට කඩිනම් පියවර ගත යුතු අතර ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා ඉඩම් ගැටළු නිරාකරණය කිරීමට පියවර ගත යුතුය. |
| (උ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට ලබා දී ඇති විදේශ ණයවලින් බැඳීම් ගාස්තු ලෙස 2020 දී රු. මිලියන 61.39 ක මුදලක් ණය දෙන ආයතනය විසින් අඩු කර තිබුණි. මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද බොහෝ ව්‍යාපෘති නියමිත දිනට නිම කර නොතිබූ අතර, එය අතිරේක බැඳීම් ගාස්තුවලට හේතු වී තිබුණි. තවද, බැඳීම් ගාස්තු ගණනය කිරීම පිළිබඳ විස්තර විගණනයට ලැබී නොතිබුණ අතර, ඒ අනුව, බැඳීම් ගාස්තුවල ඇතිවීම සහ නිරවද්‍යතාවය සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. | බැඳීම් ගාස්තුව සියලුම ව්‍යාපෘති සඳහා පොදු වන අතර ණය ගිවිසුම්වල දැඩි ණය ප්‍රඥප්තීන් හේතුවෙන් ව්‍යාපෘතිය නියමිත වේලාවට සිදු වුවද එය වැළැක්විය නොහැක. | අතිරේක බැඳීම් ගාස්තු වළක්වා ගැනීම සඳහා සැලසුම් කර ඇති පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඌ) විධිමත් පරීක්ෂණය අවසන් වී තිබියදීත්, වත්කම් කළමනාකරණ අංශයේ (බලාගාරය) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළ සිදුවී ඇති රු. මිලියන 3.67 ක තොග හිඟයට වගකිව යුතු පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු 16 වන දින දක්වා කඩිනම් පියවර ගෙන නොතිබුණි. තවද, එම සේවකයාම මණ්ඩලයේ වෙනත් කාර්යාලයක වංචාවක් සිදු කර ඇති අතර, පෙර වංචාව සැලකිල්ලට ගැනීමෙන් තොරව | ආර්.බී.වෙදගෙදර මහතාගෙන් අලාභ අයකර ගැනීම සඳහා නඩු පැවරීමට මණ්ඩලයේ නිලධාරීන් කිහිප වතාවක්ම අවශ්‍ය ලිපිගොනු සමග නීතිපති දෙපාර්තමේන්තුවට කැඳවා ඇත.<br>ආර්.බී. වෙදගෙදර මහතාගෙන් තොග හිඟය අයකර ගැනීම සඳහා 2021-11-01 දින නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පූර්ව නීතිමය සාකච්ඡාවක් පවත්වා ඇත. කෙසේ වෙතත්, එම සාකච්ඡාවෙන් පසු නීතිපති දෙපාර්තමේන්තුව විසින් කරන ලද නිර්දේශ ප්‍රධාන නීති නිලධාරී (මණ්ඩලය) වෙතින් මෙම කාර්යාලයට මෙතෙක් ලැබී නොමැත.<br>තොග ඌනතාවයන් සම්බන්ධයෙන් වූ ත්‍රිපුද්ගල කමිටු වාර්තාව සාකච්ඡා කිරීම සඳහා 2022.09.12 දින වැඩබලන සාමාන්‍යාධිකාරී | අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර යම් වංචාවක් සිදුවී ඇත්නම් සාධාරණ කාලසීමාවක් තුළ විමර්ශනයක් පවත්වා මණ්ඩලයට සිදුවන පාඩුව වළක්වා ගැනීම සඳහා විමර්ශන වාර්තාව මත වහාම විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| වංචාවේ වටිනාකම ලෙස රු. 99, 155 ක් පමණක් අය කර ගැනීමෙන් පසුව ඔහුගේ රාජකාරිය 2016 දෙසැම්බර් 05 දින අවසන් කර තිබුණි. | (CEB) සමග සාකච්ඡාවක් පවත්වන ලද අතර අදාල කටයුතු සිදුකරමින් පවති. | |
| (එ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. බිලියන 62.95 ක් වූ වේලිවල (dams) අයිතිය මණ්ඩලය විසින් පවරාගෙන නොතිබුණි. | බලාගාරවලට අදාළ සියලුම වේලි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම එහි පනත මගින් සිදු කරයි. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් ජලාශවලදී විදුලිය ලබා ගැනීම දක්වා වූ ජල මාර්ග පමණක් අත්පත් කරගෙන ඇති අතර ඒවා සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම අදාළ බලාගාර මගින් සිදු කරයි. | මණ්ඩලයේ ඉඩම් මැනීමේ සහ තක්සේරු කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |
| (ඒ) වාලච්චේන කඩදාසි සංස්ථාවට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රු. 361,992,685 ක අධිභාර සහ පොලී කපා හැරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ඉදිරියට ගෙන යාම සඳහා වාලච්චේන කඩදාසි සමාගම සහ මණ්ඩලය අතර මෙම ගිවිසුම තවමත් අත්සන් කර නොමැත. | ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 28.79 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගයෙන් සියයට 8.5 ක් නියෝජනය වන රු. බිලියන 2.46 ක තොග සෙමින් චලනය වන, චලනය නොවන සහ පළුදු වූ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. ඒ අනුව, එවැනි වර්ගයේ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොග පවත්වාගෙන යාමෙන් තොග හානිවලට, රඳවා ගැනීමේ පිරිවැය වැඩි වීමට සහ වංචාවන් සඳහා ඉඩකඩ නිර්මාණය වීමට හේතු විය හැකිය. | <u>ලක්විජය බලාගාරය – රු. 1,336,017.15</u><br>ඒවා අවශ්‍යතාව අනුව ඉතා කලාතුරකින් භාවිතා වන බැවින් ලක්විජය බලාගාරයේහි සමහර පරිභෝජනය කළ හැකි තොග සෙමෙන් චලනය වේ.<br><u>තාප සංකීර්ණය – රු.4,197,497.67</u><br>එම තොග නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.<br><u>මහවැලි සංකීර්ණය- රු.2,507,161.93</u><br>මෙම ශේෂය මුළු පරිභෝජන කළ හැකි තොගයෙන් සියයට 0.0008 ක් නියෝජනය කරන අතර අනාගතයේදී මෙම ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගනු ඇත.<br><u>ලක්ෂපාන සංකීර්ණය - රු. මිලියන 10.505</u><br>යල් පැන ගිය සහ පළුදු වූ අයිතම බැහැර කිරීම සඳහා දැනටමත් 2021/10/13 දින සෑම ස්ථානයක් සඳහාම සාමාජිකයින් හතර දෙනෙකුගේන් සමන්විත කමිටු පත් කර ඇත.<br><u>සමනල සංකීර්ණය – රු.1,573,328.03</u><br>පත් කරන ලද කමිටුවක නිර්දේශය ඇතිව, යල් | තොග හානි, රඳවා ගැනීමේ පිරිවැය සහ වංචා ආදිය වළක්වා ගැනීම සඳහා චලනය නොවන සහ සෙමින් චලනය වන තොග අඩු කිරීමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගත යුතුය. |

පැන ගිය සහ චලනය නොවන අයිතමවලින් හඳුනාගත් සමහර අයිතම බැහැර කිරීමට අතිරේක සමාන්‍යාධිකාරී (ජනන) වෙතින් දැනටමත් අනුමැතිය ලබාගෙන ඇත. වසර අවසන් වීමට පෙර ඉතිරිය නිරවුල් කරනු ඇත.

<u>වත්කම් කළමනාකරණ අංශය – රු.31,100,900</u>

<u>විදුලි බලාගාර ඒකකය (පිරිවැය කේතය: 653)</u>

හදිසි අවස්ථාවන් සඳහා ගබඩා කිරීමට අවශ්‍ය වන සහ සාමාන්‍ය ක්‍රියා පටිපාටියට අනුව පහසුවෙන් සහ කාලීනව ප්‍රසම්පාදනය කළ නොහැකි ජනක නඩත්තුව සඳහා අත්‍යවශ්‍ය අමතර කොටස් අයිතම, චලනය නොවන සහ සෙමින් චලනය වන තොගවලට ලබා දී ඇති අගයන් නියෝජනය කරයි.

පළුදු වූ සහ යල්පැන ගිය තොග වට්නාකම්වලින් බැහැර කළ යුතු අයිතම නියෝජනය වන අතර බැහැර කිරීම ආරම්භ කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගනු ඇත.

<u>වායු සමීකරණ සහ ශීතකරණ ඒකකය (පිරිවැය කේතය: 656)</u>

හදිසි අවස්ථා සඳහා ගබඩා කිරීමට අවශ්‍ය වන සහ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය යටතේ පහසුවෙන් සහ කාලීනව ප්රසම්පාදනය කළ නොහැකි, චිලර්, ඒ.එච්.යූ, පැකේජ්, සිසිල් කාමර සහ මෘත්‍යාගාර සිසිලන නඩත්තු සඳහා අත්‍යවශ්‍ය අමතර කොටස් අයිතම, චලනය නොවන තොගයට ලබා දී ඇති වට්නාකම නියෝජනය කරයි.

<u>සෝපාන ඒකකය (පිරිවැය කේතය: 657)</u>

හදිසි අවස්ථා සඳහා ගබඩා කිරීමට අවශ්‍ය වන සහ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය යටතේ පහසුවෙන් සහ කාලීනව ප්‍රසම්පාදනය කළ නොහැකි සෝපාන නඩත්තුව සඳහා අත්‍යවශ්‍ය අමතර කොටස් අයිතම, චලනය නොවන සහ සෙමින් චලනය වන තොගවලට ලබා දී ඇති අගයන් නියෝජනය කරයි.

<u>බෙදාහැරීමේ අංශය 01 – රු. මිලියන 824.14</u>

තොග මට්ටම අවම කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ග ගෙන ඇත; වර්තමානයේදී ද්‍රව්‍ය හිඟය හේතුවෙන්, සුදුසු සෑම විටම කාර්යයන් සඳහා සෙමින් චලනය වන අයිතම නිකුත් කර ඇත. මීට අමතරව, බෙදාහැරීමේ අංශය 1 හි අතිරේක සාමාන්‍යාධිකාරීගේ උපදෙස් මත බෙදාහැරීමේ අංශය 1 හි තොග මට්ටම් අවම කිරීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගෙන ඇත.

<u>බෙදාහැරීමේ අංශය 02 - රු.1,200,857,421.07</u>

2021 වාර්ෂික තොග සත්‍යාපනයෙන් පසු, රු. 26,853,254.43 ක් වූ යල් පැන ගිය සහ පළුදු වූ

| | | |
|---|---|---|
| | තොග ගබඩාවලින් ඉවත් කිරීම සඳහා 2022 මාර්තු 22 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.<br><u>බෙදාහැරීමේ අංශය 03</u><br>සබරගමුව පළාතේහි 2021.12.31 දිනට පැවතී පළුදු වූ සහ භාවිතා කළ නොහැකි තොග අඩු කර ගැනීම සඳහා 2022 කාලය තුළදී රු. 6,167,272.83 ක් වටිනා පළුදු වූ අයිතම (අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත.) අලෙවි කර ඇත.<br><u>බෙදාහැරීමේ අංශය 04</u><br>පළුදු වූ සහ භාවිතයට ගත නොහැකි තොග අයිතම අතුරින් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් රු. 3,081,087.50 කට විකිණිය හැකි තොග සහ රු. 683,669.00 ක විනාශ කර බැහැර කළ යුතු තොග අයිතම හඳුනාගෙන ඇත. නිරීක්ෂණ මත පදනම්ව යල් පැන ගිය, නිෂ්ක්‍රීය සහ පළුදු වූ තොග ගිණුම්වලින් කපා හැරීමට සහ සමාන්‍යාධිකාරී චක්‍රලේඛ අංක 2021/GM/39/FM අනුව එම අයිතම විකිණීමට හෝ බැහැර කිරීමට අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2022 මාර්තු 15 වන දින ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා විගණන කමිටුවේ සමාලෝචන අදියරේ ඇත. | |
| (ආ) ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.37 ක් වන විට විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ බලාගාර තුනකින් සහ මෙගාවොට් 24 ක අතිරේක බලාගාරයකින් සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගත් බලශක්ති ඒකකයක (කිලෝවොට් පැයක) පිරිවැය පිළිවෙලින් රු. 21.75 ක්, රු. 25.26 ක්, රු. 24.97 ක් සහ රු. 88.85 ක් විය. එම නිසා, අධික පිරිවැයකට හදිසි විදුලි බලාගාර භාවිතා කිරීම වෙනුවට තථ්‍ය කාලීන ඉල්ලුම සපුරාලීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කළේ නම් බලශක්ති මිලදී ගැනීමේ අධික පිරිවැය අඩු කර ගැනීමට හැකිව තිබුණි. | වසරේ මුල් මාස 04 තුළ වියළි කාලගුණ තත්ත්වයක් පැවතීම, පද්ධති ඉල්ලුම වැඩි වීම සහ එම කාලය තුළ ජල විදුලි ජනනය අවම බැවින් සියලුම තාප බලාගාර උපරිම බලාගාර සාධකයෙන් ක්‍රියාත්මක වේ. එබැවින් එම කාලය තුළ සියලුම තාප බලාගාරවල විදුලිය ජනනය කිරීමේ ඒකක පිරිවැය (ධාරිතාව සහ බලශක්ති ගාස්තු යන දෙකම සැලකිල්ලට ගනිමින්) සාපේක්ෂව අඩුය. එමෙන්ම, වැසි සමය ආරම්භ වීමත් සමඟ පද්ධති ඉල්ලුම අඩු වන අතර ජල විදුලි බලාගාර උපරිම බලාගාර සාධකය යටතේ ක්‍රියාත්මක වන අතර තාප බලාගාර භාවිතා කිරීමේ අවශ්‍යතාවය අඩු වේ. එහිදී බලශක්ති ගාස්තුවට වඩා ඉන්ධන පිරිවැය අඩු වන අතර ධාරිතා ගාස්තුව ගෙවීමට සිදුවේ. එමෙන්ම රාත්‍රී කාලයේ උපරිම ඉල්ලුම සපුරාලීම සඳහා වර්ෂා කාලයේදී පවා මෙම බලාගාර භාවිතා කිරීමට සිදුවේ. වර්ෂයේ විවිධ කාලවලදී විදුලිය මිලදී ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඉහත සඳහන් ඕනෑම ජනන යන්ත්‍රයක විදුලිය නිපදවීමේ ඒකක පිරිවැය ඉහළ හෝ පහළ යනු ඇත. | සැලැස්මෙහි දක්වා ඇති ක්‍රියාකාරකම් අවසන් කිරීම කඩිනම් කළ යුතුය. |

ගිවිසුම් කාලය කල් ඉකුත් වූ ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම, ඒස් පවර් ජෙනරේෂන් මාතර (පුද්.) සමාගම සහ ඒසියා පවර් (පුද්.) සමාගමේ බලාගාර වියළි කාලය තුළදී උපරිම බලාගාර සාධකය (සියයට 50 - සියයට 70) යටතේ අවම ඒකක පිරිවැයක් (කි.වො.පැය එකක් රු. 21.00 - රු. 25.00) පෙන්වා ඇත. කෙසේ වෙතත්, කොවිඩ් 19 බලපෑම හේතුවෙන් විදුලි ඉල්ලුම අඩුවීම සහ මෙහෙයුම් කාලය තුළ පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් වාලච්චේන බලාගාරය සමස්තයක් ලෙස ඉතා අඩු බලාගාර සාධකයක් (සියයට 5.4) යටතේ ක්‍රියාත්මක විය. එබැවින් ඉහළ ඒකක පිරිවැයක් පෙන්නුම් කරමින් මෙම තාප බලාගාරයේ විදුලිය නිපදවීමේ ඒකකයක පිරිවැය රු. 88.00 ක් විය.

මෙම අවස්ථාවෙහිදී, ඒකක පිරිවැය තීරණය කිරීම සඳහා ධාරිතා ගාස්තුව සලකා බලයි. කෙසේ වෙතත්, ධාරිතා ගාස්තුව මණ්ඩලය වෙත බලශක්ති බෙදාහැරීම සමග කිසිදු සම්බන්ධයක් නොමැති එකඟ වූ කාලසීමාවක් සඳහා වන එකඟ වූ පිරිවැයකි.

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කුඩා ජලවිදුලි බලාගාර සඳහා මිල නියම කිරීම ලංසු මිල පදනම්ව තථ්‍ය පිරිවැය ක්‍රමය මත කළ යුතුව තිබුණද වළකාලන ලද පිරිවැය ක්‍රමය (avoided cost method) මත ඇතැම් කුඩා ජල විදුලි බලාගාර සඳහා මිල තීරණය කර තිබුණු අතර මෙම ක්‍රමය කුඩා ජල විදුලි බලාගාරයක තථ්‍ය පිරිවැයට කිසිදු සම්බන්ධයක් නොමැත. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (dispatch) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. අංක DGM/SYC/TCH/41 දරන | නැගී එන ක්ෂේත්‍රයක් වන NCRE විදුලි බලාගාර සංවර්ධනය සඳහා ආයෝජකයින් ආකර්ශනය කර ගැනීම සඳහා ආරම්භයේ දී වළකාලන ලද පිරිවැය මත පදනම් වූ ගාස්තු ක්‍රමය හඳුන්වා දී තිබුණි. පසුව, මෙම ක්‍රමයේ අඩුපාඩු හඳුනාගෙන 2008 වර්ෂයේදී 'පිරිවැය පදනම්කරගත්, තාක්ෂණ විශේෂී, ත්‍රිත්ව ස්ථර අයක්‍රමය' ලෙස හඳුනාගත් නව ගාස්තු ක්‍රමයක් හඳුන්වා දී ඇත. වෙළෙඳපොළ බලවේග විසින් ගාස්තු තීරණය කරන තරඟකාරී ලංසු ක්‍රමයකට මෙම ක්‍රමයද පසුව වෙනස් විය. | වළකාලන ලද පිරිවැය ක්‍රමය යටතේ දැනට ක්‍රියාත්මක වන කුඩා ජලවිදුලි බලාගාර සඳහා භාවිතා කරන එම ක්‍රමය හෝ මිල වෙනස් කිරීමේ හැකියාව සමාලෝචනය කළ යුතුය. |

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන) ලිපියට අනුව ජල විදුලි බලාගාරයක සාමාන්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතුය. කෙසේවෙතත්, 2021 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය මත තීරණය කරන ලද කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 19.11 ක් සහ වියළි කාලය සඳහා රු. 20.59 ක් විය. තවද, සංඛ්‍යාලේඛන වාර්තා අනුව, 2020 දී මණ්ඩලයේ ජල විදුලි බලාගාරයක ඒකකයක පිරිවැය රු.2.49 ක් විය.

(ආ) ඒ ගැන නොසලකා, කිලෝවොට් පැයට රු. 36.20 ක ගාස්තුවක් යටතේ (වසර 20 ක් සඳහා ස්ථාවර ගාස්තුව) අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට නියමිත නාගරික ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාර පහක් සඳහා 2017 දී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, එක් ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරයක් සඳහා විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2020 දෙසැම්බර් මාසයේදී ස්වාධීන බලශක්ති නිෂ්පාදකයෙකු සමග අත්සන් කරන ලද අතර කිලෝවොට් පැයකට මුළු ගාස්තුව රු. 36.20 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. කෙසේවෙතත්, අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එයින් කිලෝවොට් පැයකට රු.13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර නොතිබුණි.

**නාගරික ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාර පහ**

NCRE ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ටෙන්ඩර් පටිපාටියේ ශක්‍යතාව පිළිබඳව කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර අපැහැදිලි භාවයක් පවතී. එබැවින්, විදුලි බලශක්ති ප්‍රසම්පාදනය තරඟකාරී ලංසු තැබීම මත පදනම් විය යුතු බවට ගරු නීතිපතිවරයා සිය මතය ප්‍රකාශ කරන ලද 2017 ජූලි මස දක්වා ප්‍රමිතිගත ගාස්තු ක්‍රමයක් භාවිතා කරමින් NCRE පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත.

මීට අමතරව, කොළඹ අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ (මහ නගර) විදුලිබල ව්‍යාපෘතිය සහ තුම්බෝවිල කරදියාන අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ (මහ නගර) විදුලිබල ව්‍යාපෘතිය සඳහා විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීම සඳහා පිළිවෙලින් 2017-10-10 සහ 2019-02-12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුකූලව මණ්ඩලය කටයුතු කර ඇත.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි, රු. 36.20 ක මුළු ගාස්තුවෙන් කි.වො.පැය එකකට රු. 13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කළ යුතුය. වෙස්ටර්න් පවර් කම්පැනි (පුද්ගලික) සමාගම වෙත ගෙවා ඇති ගාස්තුවල ඉතිරි කොටස ප්‍රතිපූරණය සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉන්වොයිස් කර ඇත. 2020 දෙසැම්බර් සිට 2021 අගෝස්තු දක්වා එකතුව රු. 633,260,550.00 ක ඉන්වොයිසි මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති නමුත් 2022 නොවැම්බර් වන විට කිසිදු ප්‍රතිපූරණයක් ලැබී නොමැත.

භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

| | | |
|---|---|---|
| (ඇ) NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණි. තවද, ඉහත සඳහන් විදුලිබලාගාර අතුරින් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 49 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කරන ලදි. | 2020 මාර්තු මාසයේ සිට කොවිඩ් 19 වසංගතය රට තුළ ප්‍රථම වරට පැතිර ගිය අතර 2021 දක්වා වරින් වර සංචරන සීමා පැනවූ බව සඳහන් කළ යුතුය. මේ හේතුවෙන් බොහෝ කටයුතු අවහිර වී ඇති අතර සියලු කටයුතු පාහේ ප්‍රමාද වී ඇත. වර්තමානයේදී, විදේශ විනිමය, බැංකු පොලී අනුපාත, උද්ධමන අනුපාතය, ද්‍රව්‍ය හිඟය, ණයවර ලිපි විවෘත කිරීමේ සීමාවන් වැනි බොහෝ පරාමිතිවල අස්ථාවරත්වය හේතුවෙන් බොහෝ ව්‍යාපෘති මූල්‍යමය වශයෙන් ශක්‍ය නොවන අතර දැනට ක්‍රියාත්මක වෙමින් පවතින NCRE ව්‍යාපෘතිවල ප්‍රගතියට සෘජුවම බලපායි. | NCRE ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය (SORP) දීර්ඝ කාලයක් තිස්සේ යාවත්කාලීන කර නොතිබුණි. | මණ්ඩලයේ එක් වෘත්තීය සමිතියක්, එනම් ලංකා විදුලිබල මණ්ඩල තාක්ෂණ ඉංජිනේරු සහ අධිකාරී සංගමය රිට් නඩු දෙකක් එනම්: CA/Writ/163/2021 සහ CA/Writ/288/2021 අභියාචනාධිකරණයේ ගොනු කර අතර, දැනට පවතින මණ්ඩලයේ SORP සංශෝධන කිරීම නතර කිරීමට අධිකරණය අතුරු තහනම් නියෝග නිකුත් කර ඇත. ඒ අනුව, දැනට පවතින SORP සංශෝධනය කිරීමට මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් ගන්නා ලද සියලුම ධනාත්මක උත්සාහයන් මෙම අතුරු තහනම් නියෝගය අභියාචනාධිකරණය විසින් අවලංගු කරන තෙක් තාවකාලිකව අත්හිටුවා ඇත. | SORP සංවර්ධනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට වහාම ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) පවත්නා SORP ට අනුව, මානව සම්පත් නිලධාරීන්ගේ (HRO) සමස්ත කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ක් බාහිරින් පුරවන අතර එම ප්‍රතිශතය වසරින් වසර ක්‍රමයෙන් සියයට 85 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. තවද, බාහිරින් බඳවා ගන්නා සියලු දෙනාටම සමාන අවස්ථා ලබා ගැනීමට නිසි උසස්වීම් ක්‍රමයක් නොතිබුණි. නිදසුනක් වශයෙන්, මණ්ඩලයේ අංශ ප්‍රධානීන් දෙදෙනෙකුගේ කාර්යයන් වැඩි කාලයක් ඉංජිනේරුවන් | මණ්ඩලයේ වත්මන් SORP හි මානව සම්පත් නිලධාරීන් සඳහා උසස්වීම් යෝජනා ක්‍රමයක් ඇතුළත් වේ. මණ්ඩලයේ අංශ ප්‍රධානීන් දෙදෙනකුගේ කාර්යයන් දීර්ඝ කාලයක් ඉංජිනේරුවන් දෙදෙනකු විසින් ආවරණය කර ඇති බව විගණන විමසුමේ සඳහන් වුවද, මෙම අයිතමය යටතේ සඳහන් කර ඇති අදාළ අංශ දෙක අපැහැදිලි වේ. එබැවින්, මේ මොහොතේ සවිස්තරාත්මක පිළිතුරක් සැපයීමට නොහැකිය. කෙසේ වෙතත්, මූල්‍ය අංශය හැර මණ්ඩලයේ සියලුම අංශ අතිරේක සාමාන්‍යාධිකාරී තනතුරු දරන විශේෂ පන්තියේ විදුලි ඉංජිනේරුවන් විසින් දරනු ලැබේ. | SORP තුළ බාහිරව බඳවා ගන්නා සේවකයින් සඳහා පැහැදිලි උසස්වීම් ලබාගැනීමේ මාර්ගයක් ඇතුළත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| දෙදෙනෙකු විසින් ආවරණය කර තිබුණි. | | |
| (ඇ) ප්‍රධාන නීති නිලධාරී තනතුර මණ්ඩලයේ ප්‍රධාන තනතුරුවලින් එකක් වූ අතර එම තනතුර නීති අංශයේ ප්‍රධානියා විය. කෙසේ වෙතත්, එම තනතුර 2014 ජූනි 03 වැනිදා සිට පුරප්පාඩුව පැවතුණි. 2021 දෙසැම්බර් 09 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී නීති අංශය ශක්තිමත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණද, එම තනතුර පිරවීමට මෙතෙක් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බාහිර බඳවා ගැනීමේ පදනම් මත සුදුසු ප්‍රධාන නීති නිලධාරියෙකු බඳවා ගැනීමට මණ්ඩලය කටයුතු කරමින් සිටී. මෙම කාර්යය ඉටු කිරීම සඳහා, අභියාචනාධිකරණයේ අතුරු තහනම් නියෝගයක් හේතුවෙන් තාවකාලිකව අත්හිටුවන ලද දැනට පවතින SORP සංශෝධනය කිරීම අවශ්‍ය වේ. මේ අතර, රජයේ ප්‍රතිපත්තියට අනුකූලව, 2023 නොවැම්බර් දක්වා සියලුම බාහිර බඳවා ගැනීම් නතර කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. මෙම හේතු දෙක නිසා, සුදුසු ප්‍රධාන නීති නිලධාරියෙකු බාහිරව බඳවා ගැනීම සඳහා දැන්වීමක් පළ කිරීමට කළමනාකාරීත්වයට නොහැකි විය. | සංවිධානයේ මෙහෙයුම් ඵලදායී හා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා ප්‍රධාන තනතුරු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| (ඈ) වැදගත් හා රහස්‍ය තනතුරක් වන අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් තනතුර 2016 ජූලි 08 සිට පුරප්පාඩු වී ඇති අතර මණ්ඩලය විසින් මෙම පුරප්පාඩුව පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් සෘජුවම වගකිව යුතුය. කෙසේවෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලයට ලේකම්වරයකු බාහිරව බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අවසර ලබා දී නොමැත. | සංවිධානයේ මෙහෙයුම් ඵලදායී හා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා ප්‍රධාන තනතුරු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| (ඉ) 2017 මැයි 29 දින සිට ව්‍යාපෘති කළමණාකරු (ඊ.ආර්.පී) තනතුර පුරප්පාඩු වී ඇති අතර පුරප්පාඩුව පිරවීමට පියවර නොගෙන එම තනතුරේ වැඩ බැලීම බෙදාහැරීමේ අංශය 4 හි අතිරේක සාමාන්‍යාධිකාරීවරයා විසින් සිදු කර තිබුණි. | ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඊ.ආර්.පී) තනතුර 2016 නොවැම්බර් මාසයේදී මණ්ඩලය තුළ ප්‍රචාරය කරන ලදි. මණ්ඩලය තුළ විවෘත අයදුම්පත් කැඳවීමෙන් සුදුසු ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට අපේක්ෂා කරන ලදි. කෙසේ වෙතත්, සුදුසු ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු තෝරා ගැනීම සඳහා පළ කළ දැන්වීම සඳහා අයදුම්පත් ලැබී නොතිබුණි. මේ හේතුව නිසා එවකට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ 1) රොහාන් සෙනෙවිරත්න මහතා ඊ.ආර්.පී ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙස 2017 මැයි 29 වැනි දින සාමාන්‍යාධිකාරීවරයා විසින් ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් සහ ජ්‍යෙෂ්ඨත්වය සැලකිල්ලට ගනිමින් වැඩ ආවරණය කිරීමේ පදනම මත පත් කරන ලදි. | සංවිධානයේ මෙහෙයුම් ඵලදායී හා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා ප්‍රධාන තනතුරු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| (ඊ) නැගෙනහිර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාවට අනුව, ඇතැම් කාර්ය මණ්ඩල කාණ්ඩවල අතිරික්ත සේවකයන් 123 ක් අනුයුක්ත | අනුමත සේවක සංඛ්‍යාවට 2018 න් පසු යාවත්කාලීන කර නොමැත. අවසන් වරට අනුමත කරන ලද සේවක සංඛ්‍යාවට හා සසඳන විට සමහර පුහුණු සේවකයින්ගේ පුරප්පාඩු පවතින අතර සමහර සේවක කාණ්ඩවල අතිරික්තයන් පවතී. එබැවින්, පුහුණු සේවක අවශ්‍යතා නුපුහුණු හෝ අර්ධ-පුහුණු | අවශ්‍ය පිරිස් බලය හඳුනාගෙන ඒ අනුව බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

<table>
<tr>
<td>කර තිබුණි. කෙසේ වෙතත්, එසේ තිබියදීත්, පුහුණු සේවකයින් 57 ක්, අනියම් පදනමින් සේවකයින් 163 ක් සහ මැන්පවර් හරහා කුලී පදනම මත සේවකයින් 14 ක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයට (නැගෙනහිර) අනුයුක්ත කර තිබුණි. තවද, එම කාර්යාලයට සේවක සංඛ්‍යාව ඉක්මවා මනු කියවන්නන් 58 ක් අනුයුක්ත කර තිබුණි. කෙසේ වෙතත්, එම කාර්යාලයේ සේවක සංඛ්‍යාවේ ඇතුළත් සමහර සේවක කාණ්ඩවල පුරප්පාඩු 365 ක් පැවතුණි.</td>
<td>සේවකයන් මගින් ආවරණය කෙරේ. මෙය සමහර සේවක කාණ්ඩවල සේවක හිඟයක් හෝ අතිරික්තයක් ඇති කරයි.</td>
<td></td>
</tr>
<tr>
<td>(උ) අනුමත සේවක සංඛ්‍යාවට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ලක්විජය බලාගාරයේ තාක්ෂණික තනතුරු 19 ක පුරප්පාඩු 260 ක් නිරීක්ෂණය විය.</td>
<td>තාක්ෂණික තනතුරු 19 ක සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර
<table>
<tr><th>2018 අනුමත පුද්ගල සැලැස්ම අනුව අනුමත සේවක සංඛ්‍යාව</th><th>2021-12-31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව</th><th>2021-12-31 දිනට පුරප්පාඩු</th></tr>
<tr><td>479</td><td>219</td><td>260</td></tr>
</table>
බාහිර බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීමේ රජයේ ප්‍රතිපත්තියට අනුව, 2023 නොවැම්බර් දක්වා සියලුම බාහිර බඳවා ගැනීම් නතර කිරීමට මණ්ඩලය ද තීරණය කර ඇත. එසේ වුවද, ලක්විජය බලාගාරයේ පවතින මෙම පුරප්පාඩු අභ්‍යන්තර බඳවා ගැනීම් / උසස්වීම්වලින් හැකි තරම් පිරවීමට කළමනාකාරිත්වය උත්සාහ කරනු ඇත.<br>
බලාගාරය විශ්වාසනීය තත්ත්වයෙන් පවත්වාගෙන යාමේ අරමුණින් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා ඉහත තාක්ෂණික තනතුරුවල පුරප්පාඩු පිරවීමට අදාළ නියෝජ්‍ය බලාගාර කළමනාකරුවන්ගේ නිර්දේශ මත අවශ්‍ය සේවය බාහිරින් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලදි.</td>
<td>එම කරුණ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.</td>
</tr>
</table>